# සහතික පිටපත

## නඩු අංකය: 73047/21

තිස්සමහාරාම දිසා/මහේස්ත්‍රාත් අධිකරණය.

(1)

බැඳිමතෙකු විසින් රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන ලද රතුන් තැටියක් දේවාල මාලිගාවේ තැන්පත් කර එහි තබා තිබිය යුතුව තිබියදී දේවාලයේ කපු මහතුන් විසින් එම තැටිය දේවාල මාලිගාවෙන් රැගෙන ගොස් සාපරාධී විශ්වාසය කඩ කිරීම හා සාපරාධී සාවද්‍ය පරිහරනය කිරීම සම්බන්දයෙන් විමර්ශනය සිදු කරන බවට ගරු අධිකරණයට කරුණු වාර්ථා කිරිම

පොලිස් / பொலிஸ் ] 55
(F2 Orig. & Dup. S. & T.) 05/80

ශ්‍රී ලංකා පොලීසිය/இலங்கைப் பொலிஸ்

මහෙස්ත්‍රාත්වරයා වෙත සැපයෙන තොරතුරු

RIB(U01)-3[illegible] நீதவானுக்கு [illegible] தகவல்

2022/01/12
ම/ඝා

පො. පො. පිටුව / த. ா. பக்கம் ] IR 11/21 - U01

පො. පො. ඡේදය / த. எ. பந்தி ]

අධිකරණය / நீதிமன்றம் ] තිසස්මහාරාම මහේස්ත්‍රාත් අධිකරණය

ස්ථාන අංකය : අ. වැ. ලේ. / நிலைய இல. : குற்றம் சாட்டுதற்க முற்றப் பதிவேடு ]

නඩුවේ අංකය / வழக்கு இல. ] බී 73047 /21

අ. තො. වෙ. වැ. ලේ. / குற்றமேற்றத்தாத ஏற்றறய முற்றங்களின் பதிவேடு ]

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XI වැනි පරිච්ඡේදයේ 115 (1), (2), (3), (4), 120 (1), (2), (3) වැනි වගන්ති යටතේ
වරදක් විමර්ශනය කිරීමේ වාර්තාව

தவறொன்றின் புலனாய்வு பற்றி தேசிய அரசுப் பேரவையினது 1979 ஆம் ஆண்டின் 15 ஆம் இலக்க குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவைச் சட்டத்தின் 115 (1), (2), (3), (4), 120 (1), (2), (3) ஆகிய பிரிவுகளின் கீழான அறிக்கை

බැතිමතෙකු විසින් රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන ලද රතුන් තැටියක් දේවාල මාලිගාවේ තැන්පත් කර එහි තබා තිබිය යුතුව තිබියදී දේවාලයේ කපු මහතෙකු විසින් එම තැටිය දේවාල මාලිගාවෙන් රැගෙන ගොස් සාපරාධී විශ්වාසය කඩ කිරීම හා සාපරාධී සාවද්‍ය පරිහරනය කල බවට

මහෙස්ත්‍රාත්වරයා වෙතින / நீதவானுக்கு,

අංක 51/ඒ සංහපුර, බත්තරමුල්ල පදිංචි

රුහුණු මහා කතරගම දේවාලයේ බස්නායක නිළමේ වන ඩිෂාන් වික්‍රමරත්න ගුණසේකර විසින්

~~2021.10.19~~ කොළඹ අපරාධ

20 ~~කොමිෂන් කාර්‍යාලයේ වැඩ බලන ප්‍රධානී~~ [illegible] සිදු කරන ලද පැමිණිල්ලක් විභාග කළ බව ______

______ සි ______ වන මම මෙයින් වාර්තා කරමි.

............ என்னுடைய சேர்ந்த

............ ஆகிய நான்

20...... ஆம் ஆண்டு ............ மாதம் ............ நாளன்று ............

என்னுடைய சேர்ந்த ............ என்பவர் செய்த ............

............

............ என்ற பொருள்பற்றும் முறைப்பாட்டினைப் பற்றி விசாரித்தவனென என இத்தால் அறிவிக்கின்றேன்.

| | |
|---|---|
| පරීක්ෂණයේදී නිශ්චය කොට දනගත් කරුණු සහ පැමිණිල්ල සනාථ කරන තවත් සාක්ෂි කරුවන් සිටිවෙතු වේ නම්, ඔවුන්ගේ සාක්ෂි<br>விசாரணையில் கண்டறியப்பட்ட நிகழ்வுகளும் முறைப்பாட்டுக்காதாரமாக மேலதிக சாட்சிகளின் சான்று விபரமும் இருப்பின் அதுவும் | |
| විදිතයාගේ සාක්ෂිකරුවන්ගේ නම හා ලිපිනය සහ ඔවුන්ගේ සාක්ෂි කෙටියෙන්.<br>குற்றஞ்சாட்டப்பட்டவர்களது சாட்சிகளின் பெயரும் முகவரியும் சுருக்கமாக அவர்களது சாட்சியமும். | වාර්ථාව පසු පිටේ |
| විදිතයා අධිකරණයට යවන ලද්දේ සිරභාරයේ ද නැතහොත් ඇප පිට ද යන වග, ඇප පිට නම්, ඇප මුදල ඇතිකිය යුතුය<br>குற்றஞ்சாட்டப்பட்டவர் கட்டுக்காவலிலா அல்லது பிணையிலா விடப்பட்டுள்ளார் என்பது. பிணையிலாயின் பிணைமுறிகள் இணைக்கப்பட வேண்டும். | |
| දඩුවම් කෙරෙන ද්‍රව්‍ය තිබිවත් අධිකරණය වෙත යවා ඇත්නම් ඒ පිළිබඳ ලැයිස්තුව<br>நீதிமன்றத்துக்கனுப்பப்பட்ட சான்றுப்பொருள்கள், ஏதேனுமிருப்பின் அவற்றின் நிரல் | |

මහේස්ත්‍රාත් අධිකරණය තිස්සමහාරාම 09 MAR 2022

විමර්ශනය භාර නිලධරයා.
புலனாய்வுக்குப் பொறுப்பான உத்தியோகத்தர்.

2019.07.03 වන දින බැතිමතෙකු විසින් රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන ලද තැටියක් දේවාල මාලිගාවේ තැන්පත් කර එහි තබා තිබිය යුතුව තිබියදී දේවාලයේ කපු මහ විසින් එම තැටිය දේවාල මාලිගාවෙන් රැගෙන ගොස් සාපරාධී විශ්වාසය කඩ කිරීම හා සා සාවද්‍ය පරිහරනය කිරිම සම්බන්දයෙන් රුහුණු මහා කතරගම දේවාලයේ බස්නායක නිළමේ ඩිෂාන් වික්‍රමරත්න ගුණසේකර විසින් 2021.10.19 වන දින කොළඹ අපරාධ කොට්ඨාශය පැමිනිලි කරන ලදි.

එකී පැමිණිල්ල ගරු පොලිස්පතිතුමා විසින් ලබාදුන් උපදෙස් අනුව සහකාර පොලිස් අධිකාරි ද සිල්වා මහතා විසින් අධ්‍යක්ෂතුමා වෙත දැනුම්දිමෙන් පසුව සහකාර පොලිස් අධිකාරීතු උපදෙස් අනුව කොළඹ අපරාධ කොට්ඨාශයේ විමර්ශන ඒකක 01 මගින් විමර්ශණ ආරම්භ කර බවට ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්ථා කරමි.

01. 2020.09.25 දින සිට වසර 05 ක දක්වා පැමිණිලිකරු රුහුණු මහා කතරගම දේවා බස්නායක නිළමේ වශයෙන් කටයුතු කරයි.
02. රුහුණු මහා කතරගම දේවාලය හා ඊට අදාළ දේපලවල නීත්‍යානුකූල භාරකාර පැමිණිලිකරු සතුව ඇති බවත් දේවලය සතුව පවතින හා දේවලයට පූජාකරන භාණ්ඩ වට්ටෝරුගත කර පවත්වාගෙන යන බවත්, දේවලය සතු රත්‍රන් දේපළ දේවාලයේ සේප්පු , ඇතුල් මළුවේද, ලංකා බැංකුව කතරගම ශාඛාවේද තැම්පත් කර තිබෙන බවත් අනාවරණය කර ඇත.
03. පැමිණිලිකරු සෑම සතියකම දින දෙකක් හෝ තුනක් කතරගම දේවාලයේ රැදී සිට රා කරන අතර ඔහු 2021.10.17 දින හෝ ඊට ආසන්න දිනක කතරගම සිට කොළඹ එන අත පැමිණිලිකරුට, අංක 0775955124 දරණ දුරකථන අංකයෙන් පැමිණිලිකරුගේ 0777260068 අංකයට ලද ඇමතුමක් මගින් දේවාලයේ ඇතුල් කට්ටලයේ තිබෙන රන් භ සොරකම් කර තිබෙන බවත්, එම සොරකම ගැන දැනුවත් දෙදෙනෙකුගේ නම් පවසා ඇත ලියා ගැනිමට නොහැකි නිසා එමනම් කෙටි පණිවිඩ මගින් දැනුම් දෙන ලෙසට දැනුම් දි ඉන් පසු දුරකථන ඇමතුම ලබා දුන් තැනැත්තා එම අංකයෙන්ම රාළහාමිගේ කුක් සුජි පත්තිනි දේවාලයේ අම්ල බවට එස්.එම්.එස්. කර ඇත. දුරකථනයෙන් කතා කළ දේවාලයේ වැඩ කරන කෙනෙක් බවට දැනුම් දී ඇත.
04. ඉන් පසු පැමිණිලිකරු දේවාලයේ ප්‍රධාන කපු මහතා වන සේපාල වී රත්නායක මහතාගේ 0779500280 කතාකර දේවාලයේ රත්‍රන් සොරකමක් සම්බන්ධයෙන් දැනුම් දී ඇත සිද්ධියෙන් පසුව එදාම පැමිණිලිකරුට නැවතත් 0784539180 දුරකථන අංකයෙන් ල ඇමතුමෙන් කතා කළ අය විසින් සමන් ප්‍රියන්ත කපු මහතා දේවාලයේ රත්‍රන් බඩු සො කර ඇති බවත් සොරකම් කරන ලද රත්‍රං තැටියේ ඡායාරූප ඇති බව සඳහන් කරමින් ඡායාරූප ද එවා ඇත.
05. ඉමෝ හරහා පැමිණිලිකරුට පින්තූර වගයක් හා පනිවුඩයක් 0784539180 දරණ අංකයෙ එවා ඇත. එම පින්තූරවල රන් තැටියක් හා පියනක්, රත්‍රන් බිස්කට් කිපයක්, ඇතුළත් පින්ත ඉලෙක්ට්‍රොනික් තරාදියක් මත රිදිපාට තැටියක් සහිත 29.356 වශයෙන් සඳහන් පින්තූරය එම පින්තූර අතර යම් කිසි පුද්ගලයෙකු රත්‍රන් තැටිය අතැතිව සිටින පින්ත කිහිපයක්ද තිබි පනිවුඩයේ "බස්නායක නිළමේතුමනි රුහුණු මහා කතරගම දේවාලයේ මාලිගාව තු සොරකමක් සම්බන්ධවයි මෙය පවුම් 38කින් යුත් පූජා භාන්ඩයකි. මෙය ගබඩාරාළ රැගෙන ගොස් ඇත. විකුණා ඇත. මෙය අනුග්‍රහය දැක්වූ අය මෙය දැක ගැනිමට පැමිනෙණ බව සුජිත් කියන කෙනා පවසා ඇත. සුජිත් යනු එම රන් ආභරණය පූජා කළ සම්බන්ධ කර කෙනාය. 2020.09.03 මෙය රැගෙන ගොස් ඇත. මෙය දැනට මකවා, වි ඇත. මෙය නැවත සාදා දේවාලයේ මාලිගාව තුළට රැගෙන ඒමට මොහුගේ සැළැස්මක් අ ආරංචි වේ මෙවැනි අකටයුතු මෙම පූජනීය ස්ථානයේ නොවීමට ඔබතුමා වගබලා ගනී අපගේ බලාපොරොත්තුවයි මෙයයි සොරකම් කර පූජා භාණ්ඩය " වශයෙන් සඳහන්ව ඇත
06. ඡායාරූපවල දක්වා ඇති සොරකම් කළ බවට සදහන් රත්‍රන් දේපළ දේවාලය තුළ තිබූ එ යන්න නිවැරදිව පැවසීමට හැකියාවක් නොමැති බවත්, මෙවැනි ආකාරයේ සොරකමක් ඇත්නම් මේ පිළිබදව පරීක්ෂණයක් කර නීතිය ක්‍රියාත්මක කරන ලෙසත් පනිවුඩය අනුව භාණ්ඩ සොරකම් කළ බවට සදහන් ගබඩාරාළ යනු එම්.එම්. සමන් ප්‍රියන්ත යන කපු බවත්, සොරකම් කළ රත්‍රන් දේපළ පූජා කිරීමට සම්බන්ධ වූවා යැයි කියන සුජිත් යන කවුරුන්ද කියා මම දන්නේ නැති බවත්, තවදුරටත් මේ සම්බන්ධයෙන් කරුණු සොයා දෙන බවටත් 2021.10.19 දින පැමිණිලිකරන ලදි.
07. ඉන් පසු නැවත පැමිණිලිකරු 2021.10.27 දින වැඩිදුර ප්‍රකාශයක් ලබා දෙමින් දේවා සොරකම් කරන ලද රත්‍රන් තැටිය ඉවුම් පිහුම් කටයුතු කරන සුජිත් හා පත්තිනි දේවාලයේ සමන් ප්‍රියන්ත කපු මහතාගේ මැදිහත් වීම මත පැමිණි බැතිමතෙකු විසින් රුහුණු මහා කත දේවාලයට රත්‍රන් පවුම් 28 ක් පමණ බර රත්‍රන් තැටියක් 2019 පෙරහැර මාසයේදි රුහුණු කතරගම දේවාලයට පූජා කල බවත් එය පූජා කල අවස්ථාවේ එම රත්‍රන් තැටිය භාර ඇත්තේ සමන් ප්‍රියන්ත කපු මහතා බවත් ඉන්පසු එම රත්‍රන් තැටිය ප්‍රධාන කපු මහත සෝමපාල රත්නායක මහතා වෙත භාර දීමෙන් පසු දේවාලයේ තැන්පත් කල බවත් ඉන් කිහිපයකට පසු තැටිය පේ කර නැවත තැටිය පූජා කල බැතිමතා වෙතම සමන් ප්‍රියන්ත මහතා විසින් බාර දී ඇති බවත් ඒ අවස්ථාවේ එම තැටිය පූජා කල බැතිමතා පිලිබදව විමේ

ඔහු ගැන කරුණු නොදන්නා බවත් විදෙශ රටක සිටින බවත් කියා සිටි බවත් දුරකථන අංකයක් පිලිබදව විමසීමේදී නොදන්නා බවත් කියා සිටි බවත් ඒ අනුව දේවාලයට බැතිමතකු පූජා කල රත්‍රන් තැටිය දේවාලය තුල තිබිය යුතුව තිබියදී දේවාලයෙන් ආපසු ගෙන ගොස් ඇති බවත් සදහන් කර ඇත.

08. තවද සමන් ප්‍රියන්ත කපු මහතා විසින් දේවාලයට අගෞරවයක් වන නිසා එම රත්‍රන් තැටිය නැවත සාදවා දේවාලයට 2021.10.25 දින ලබා දෙන බව කියා සිටි බවත්, ප්‍රධාන කපු මහතා වන සොමිපාල රත්නායක මහතාගේ නිවසට ගිය අවස්ථාවේදී රන් පැහැති බන්දේසියක් ඔහුගේ ගෙදර තිබෙන බවත් එම බන්දේසිය දේවාලයේ පරිපාලන ලේකම්තුමා වෙත බාර දෙන ලෙස සොමිපාල රත්නායක දැනුම් දුන් නිසා රැගෙන ආ බවත් පවසමින් 2021.10.26 දින දේවාලයට පැමිණි අංක 02 වී , සෙල්ලපාර ,කතරගම පදිංචි එන්.එම්.අජිත් පුෂ්පකුමාර නැමැති අය විසින් රත්‍රන් පැහැති තැටියක් දේවාලය වෙත ගෙන විත් තිබු බවත්, ඉන්පසු ඒ සම්බන්ධයෙන් ලිපියක් ලියා ගෙන පරිපාලන ලේකම් විමලරත්න , ගණකාධිකාරී දමිත් සහ ආරක්ෂක නිළදාරියෙකු ඉදිරියේ මුද්‍රා තබා රත්‍රන් පැහැති තැටිය බාරගෙන ඒ සදහා අංක 5296 දරණ කුවිතාන්සිය එන්.එම්.අජිත් පුෂ්පකුමාර වෙත නිකුත් කර තිබු බවත්, එලෙස බාර දෙන ලද රත්‍රන් තැටිය සහ එය බාර ගැනීමට අදාලව ලබා දෙන ලද ලිපිය පරිපාලන ලේකම් බාරයේ දේවාලයේ සේප්පුවේ තබා තිබෙන බවත්, එම සේප්පුවේ යතුර පරිපාලන ලේකම් බාරයේ තිබෙන බවත්, එක් යතුරක් පැමිණිලිකරු භාරයේ තිබෙන බවත් සදහන් කර ඇත.

09. මේ අනුව කපු මහතුන් විසින් බැතිමතෙකු විසින් පූජා කරන ලද රත්‍රන් තැටිය දේවාලයෙන් රැගෙන ගොස් විකුණා මුදල් ලබා ගෙන නැවත එම රත්‍රන් තැටිය ආකාරයට රත්‍රන් තැටිය සකසා දේවාලයට මෙලෙස බාර දී ඇති බවත්, මෙසේ සිදු කර ඇත්තේ මෙම රත්‍රන් තැටිය දේවාලයෙන් රැගෙන ගොස් ඇති බවට තොරතුරු අනාවරනය වීම නිසා ඒ ගැන සොයා බැලීමක් කල නිසා බවත්, කපු මහතුන් දේවාලය සතුව තිබූ රත්‍රන් තැටිය ඔවුන්ගේ ප්‍රයෝජනය සදහා රැගෙන ගොස් ඒ ගැන සොයා බැලීමක් කල නිසා නැවත රත්‍රන් තැටිය දේවාලය වෙත ලැබීමට සලස්වා ඇති බවත්, 2019 පෙරහැර මාසයේදී රත්‍රන් තැටියත් පූජා කිරීමට අදාලව බඩු වට්ටෝරු පොතට පවා ඇතුලත් කර නොමැති බවත්, මේ සම්බන්ධව අදාල නිතිමය ක්‍රියා මාර්ග ගන්නා ලෙසත් ඉල්ලීම් කරඇත.

10. මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සදහා පහත සදහන් අයවළුන්ගේ ප්‍රකාශයන් වාර්ථා කරන ලදි. එකී ප්‍රකාශන් වල සම්පිණ්ඩන මෙසේය.

i. <u>ලියන ආරච්චිගේ විමලරත්න රුහුණු මහා කතරගම දේවාලයේ පරිපාලන ලේඛම්,</u>

2020.10.05 දින සිට මේ දක්වා රුහුණු මහා කතරගම දේවාලයේ පරිපාලන ලේඛම් වශයෙන් කටයුතු කරයි. රුහුණු මහා කතරගම දේවාලයේ කපු මහතුන් වශයෙන් 15 දෙනෙකු දැනට සේවය කරන බවත්, ප්‍රධාන කපු මහතා වශයෙන් සොමිපාල රත්නායක කටයුතු කරන බවත්, අනෙක් කපු මහතුන් වශයෙන් දේවාලයේ මාලිගාවේ ගබඩාව භාර කපු මහතා ලෙස එම්.එම් සමන් ප්‍රියන්ත මුනසිංහ,පෙරහැර බලන රාල වශයෙන් සරත් සේපාල රත්නායක,අලි ඇතුන් භාර කපු මහතා වශයෙන් ටී.ආර්. ලලිත් රත්නායක, දියකපන කපු රාල වශයෙන් උපුල් නිශාන්ත, තේවා කපුරාල වශයෙන් කරුණාරත්න ටී රත්නායක, ලාල් ආරපක්ෂ,ආනන්ද ටී රත්නායක,ලලිත් අනුරුද්ධ මුනසිංහ,ටී.ආර්.සනත් ප්‍රේමකුමාර,ටී.ආර් අනුර තිබිලත් රත්නායක සිනෙත් පියුෂාන්,අරාපක්ෂ මුදියන්සේලාගේ ගයාන් චමිල බණ්ඩාර, සචිත් ශානක තිබිලත් රත්නායක,ටී.ආර් දේවින්ද සම්පත් යන අය වලුන් කටයුතු කරන බවත්, රුහුණු මහා කතරගම දේවාලයට බැති මතුන් පැමින පූජා කරනු ලබන භාණ්ඩ පූජා කරන්නේ රුහුණු මහා කතරගම දේවාලයට වන බවත්, මාසය භාර කපු මහතා වශයෙන් සෑම මාසයකටම තේවාව භාරව කලින් සදහන් කල කපු මහතුන් අතරින් අයෙක් කටයුතු කරනු ලබන බවත්, ඔහුගේ සහයට තවත් කීප දෙනෙකු කටයුතු කරන බවත්, බැතිමතුන් පූජා කරන වටිනා භාණ්ඩ දේවාල මාලිගාවේ ගබඩාවේ තැන්පත් කර තැබිය යුතු බවත්, දේවාල මාලිගාව ගබඩාව භාරව කටයුතු කරන්නේ එම්.එම් සමන් ප්‍රියන්ත කපු මහතා බවත්, දේවාල මාලිගාවට ඇතුලු විය හැක්කේ ඉහත සදහන් කල කපු මහතුන් 15 දෙනාට සහ බස්නායක නිලමේ තුමාට පමණක් බවත්, මේ දක්වා වෙන අය කිසිවෙක් ඉහත අයට අමතරව දේවාල මාලිගාවට ගොස් නොමැති බවත්, එක් කපු මහතෙකු මාසය බාර කපු මහතා ලෙස සෑම මසකම නැකැත් අනුව පත් කරන බවත්, බස්නායක නිලමේතුමා ඇසල මස පෙරහැර අවසන්ව දිය කැපීමෙන් පසු ඉටු කරන පළමු රාජකාරිය කපු මහතුන් වෙත එක් වසරක් සදහා රු.2.82 ක් දීමනාව වශයෙන් ලබා දී මහබෙත්මෙ ලේඛම් දයානන්ද අධිකාරී මහතා භාරයේ ඇති ලේඛණයේ අත්සන් තැබීම සිදු කරන බවත්, මාසයක් අවසානයේ අනෙක් මාසය සදහා කපු මහතෙකු පත් කුරන අවස්තාවේ දේවාල මාලිගාවේ ගබඩාව භාර කපු මහතා විසින් දේවාල මාලිගාවේ ගබඩාවේ යතුර මාසය භාර කපු මහතා වෙත භාරදෙනු ලබන බවත්, ඒ අනුව රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන භාණ්ඩ දේවාල මාලිගාවේ තැන්පත් කර තැබිය යුතු අතර ඒවා භාරයේ තිබෙන්නේ ඉහත සදහන් කල කපු මහතුන් වෙත බවත්, බස්නායක නිලමේ තුමා 2021.10.20 දින දේවාලයට පැමිණ කපු මහතුන් කිහිප දෙනෙකු සමග සාකච්චා කර පිටව ගොස් දුරකතනයෙන් දේවාලය ඇතුලෙ ලොකු සිද්ධියක් වෙලා තියෙනවා විමලරත්න මහත්තයට මම පස්සෙ කියන්නම් කියා කිව් බවත්, ටිට පැය කිපයකට පසු ප්‍රධාන කපු මහතා වන සොමිපාල රත්නායක දුරකතනයෙන් කථා කර

(4)

දේවාලෙ මාලිගාවේ තිබුනු රත්‍රං තැටියක් වුටි කපු මහත්තය ගෙදර ගෙනිහිල්ල තියෙන්
ඒක වුටි කපු මහත්තය ගෙනැල්ල දේවි ලේඛම් තුමා ඒක භාරගෙන කුවිතාන්සියක් ල
දිල එයාගෙන් ලියුමකුත් ගන්න කිව් බවත්, දුන් පසු එම සිද්ධිය බස්නායක නිලමේ තුමා
දුරකතනයෙන් දැනුම් දුන් බවත්, වුටි කපු මහතා රත්‍රං තැටිය රැගෙන ආවෙ නොම
නිසා වුටි කපු මහතාට දුරකතනයෙන් කථා කල විට ඔහු කොළඹ සිටින බවත්, ද
දෙකක් ඇතුලත රත්‍රං තැටිය ගෙනත් දෙන බවට කියා සිටි බවත්, 2021.10.26 දින රත්‍රං
තැටිය එන්.එම් අජිත් පුෂ්ප කුමාර යන විසින් රැගෙන විත් රත්‍රං බඩුවක් බාරදෙන්න
තියෙනවා මේක බාරදෙන්න කියල සමන් ප්‍රියන්ත මහත්තය කිව්වා. සෝමප
රත්නායක මහත්තයලගෙ ගෙදරත් ගිහිල්ල තමයි ආවෙ කියා කිව් බවත්, ඒ පිළිබ
බස්නායක නිලමෙ තුමාට දැනුම් දුන් විට රිසිට්පතක් නිකුත් කර බාරගන්නා ලෙස
ලැබුණු උපදෙස් අනුව ගණකාධිකාරී ගමාච්චිගේ දමිත් දර්ශන හා ප්‍රධාන ආරක්ෂ
නිළදාරි එන්.ඒ වෙලිසන් කුමාර ඉදිරියේ රත්‍රං තැටිය භාරගත් බවත්, ඒ සම්බන්දයෙ
අංක 5296 දරන කුවිතාංසිය නිකුත් කර මුල් පිටපත ඔහුට භාරදුන් බවත්, ඔහු විසි
කුවිතාංසිය ඔහුගේ නමින් නිකුත් නොකරන ලෙසත් රත්‍රං තැටියේ පිටිපස්සේ තිබෙ
නමට නිකුත් කරන ලෙසට කියා සිටි බවත් නමුත් එසේ නොකර භාර දුන් අයගේ නම
රිසිට්පත නිකුත් කල බවත්, රත්‍රං තැටිය භාරදීම සම්බන්දයෙන් ලිපියක් ලියා දෙන ලෙස
ඉල්ලා සිටි විට ලියල දෙන්න අත්සන් කරන්න කිව් බවත්, ඉන් පසු ඔහු පැවසු ආකාරය
ලිපිය ලිවීමෙන් පසු එම ලිපිය කියවා බලා ලේඛම් මහතා ලවා ලියවා කියවා බැලීමෙ
පසු නිවැරදි බවට අත්සන් කරමි යනුවෙන් ඔහු විසින් ලියා අත්සන් කර ඔහුගේ ජාති
හැදුනුම්පත් අංකයද ඔහුගේ අත් අකුරින්ම ලිව් බවත්, එය ගණකාධිකාරී සහ ප්‍රධා
ආරක්ෂක නිලධාරී අත්සන් කල බවත්, පසුව එම රත්‍රං තැටිය ගණකාධිකාරී සහ ප්‍රධා
ආරක්ෂක නිලධාරී ඉදිරියේ පොලිතින් වලින් හා කොළ වලින් ඔතා ලාකඩ මුද්‍රා ත
කර බස්නායක නිලාමේ තුමාගේ නිල නිවසේ ඇති සේප්පුවේ තැන්පත් කර සේප්පුවෙ
යතුරත් ලියුම් කවරයක දමා වේජ් ඔතා ගණකාධිකාරී වෙත භාරදුන් බවත්, බැති මනු
දේවාලයට පූජා කරන භාණ්ඩ දේවාල මාලිගාවේ තැන්පත් කරන නිසාත් එයට යාම
නොහැකි නිසාත් එහි තබා තිබෙන භාන්ඩ මොනවාද කියා කියන්න හැකියාවක් නොම
බවත්, බාරගත් රත්‍රං තැටිය බැතිමතෙකු දේවාලයට පූජා කරන ලද්දක් නම් එය දේවාල
තුල තිබිය යුතු බවත්, ඉහත පරිදි නැවත බාරදුන්නේ එය දේවලයට පූජා කල පසු එ
නැවත රැගෙන ගොස් ඇති නිසා වන බවත්, රත්‍රං තැටිය භාරගත් දිනට පසු දින ප්‍රධාන ක
මහතා වන සොම්පාල කපු මහතා දුරකතනයෙන් කථා කර රත්‍රං තැටිය භාරදුන්නාද කි
විමසූ බවත්, ඔහුට වුටි කපු මහත්තය නෙවෙයි එයාගෙ මල්ලී කෙනෙක් කියල කිව්
අජිත් පුෂ්ප කුමාර යන අයෙක් රත්‍රං තැටිය භාරදුන් බවට කියා සිටි බවත් එවිට සොම්පා
කපු මහත්තය විසින් ලියුමකුත් දුන්නාද කියා විමසූ බවත්, වුටි කපුමහත්තය හොරෙ
ගබඩා රාල කමෙන් අස්කරන්න ඕනි කියා කිව් බවත්, .සදහන් කරමින් ප්‍රකාශ ලබා
ඇත.

ii. <u>සරත් සේපාල තිඹලත් රත්නායක සෙල්ල කතරගම පාර, කතරගම,රුහුණු මහා කතරග</u>
<u>දේවාලයේ කපු ධුරන්ධර</u>

1980 සැප්තැම්බර් සිට මේ දක්වා රුහුණු මහා කතරගම දේවාලයේ කපු ධුරන්ධර තන
දරයි. බස්නායක නිලමේ වශයෙන් ඩිෂාන් වික්‍රමරත්න ගුණසේකර මහතා කටයුතු කර
බවත්, රුහුණු මහා කතරගම දේවාලයේ කපු ධුරන්ධර දරන 15 දෙනෙකු සිටින
මාසික තේවය සදහා ඒක් මාසයකට ඒක් කපු ධුරන්ධර කෙනෙක් කටයුතු කරන බව
කපු ධුරන්ධර දරණ 15 දෙනාගෙන් 10 දෙනෙකුට පමනක් මාසික තේවාව යොදව
බවත්, තමාටත් එක් මාසික තේවාවක් හිමිවන බවත්, දේවාල මාලිගාවට ඇතුල්වී
හැක්කේ කපු ධුරන්ධර 15 දෙනාට සහ බස්නායක නිලමේ තුමාට පමණක් බවත
බැතිමතුන් රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන රත්‍රං වැනි භාණ්ඩ දේවා
මාලිගාවේ තැන්පත් කරන බවත්, බස්නායක නිලමේතුමා විසින් පසුගිය මාසයේ ම
හරියේ දිනක දුරකථනයෙන් කථා කර රාළහාමිගේ උයන මිනිහයි ෆුඩ් සිටියේ ද
තට්ටුවේ කපු මහත්තයයි සම්බන්ධ වෙලා පූජා කරපු රත්‍රං බඩු වගයක ප්‍රශ්නය
තියෙනවා මොකද්ද ප්‍රශ්නේ කියලා විමසූ බවත්, ඒ වන විට දේවාලයට පූජා කරපු රත්‍රං
භාණ්ඩයක් රැගෙන ගොස් ඇති බවට රාවයක් පැතිර තිබුණ බවත්, ඒ වන විට සුජිත් ය
අයගේ දුරකථනයේ තිබු රත්‍රං තැටියක ඡායරූප සුජිත් විසින් පෙන්වා සිටි බවත්, සුජි
විසින් එය පූජා කරපු ඒකක් බව පැවසු නමුත් ඒවැනි රත්‍රං තැටියක් දේවාල මාලිගා
තිබෙනවා නොදුටු බවත්, බස්නායක නිලමේ තුමාට කතාවක් තියෙනවා. ඒ ගැන ක
කරගන්න ඒන්න කිව් බවත්, ඊට පසු දවසක බස්නායක නිලමේ තුමා දේවාලයට පැමි
බවත්, තමාත් ඉහුම් පිහුම් කටයුතු කල සුජිත් යන අයත්, පත්තිනි දේවාලයේ අමිල
ගබඩාව භාර කපු මහතා වන සමන් ප්‍රියන්තත් ,දියකපන උපුල් කපු මහතාත් ස
බස්නායක නිළමේතුමා කථා කල බවත්, ඒ අවස්ථාවේ සුජිත්ගේ ජංගම දුරකථනයේ ති
රත්‍රං තැටියේ පින්තූර නිලමේ තුමාගේ ජංගම දුරකථනයේ ද තිබු බවත්, නිලමේ තුම
පින්තූර පෙන්නලා විමසන විට සමන් ප්‍රියන්ත කපු මහතාත් සුජිත් සහ අමිලත් ඒ රත්‍රං
තැටිය දේවාලයට පූජා කරලා පේ කරලා දවස් 03 කින් විතර ආපහු අරගෙන ගිය බව
ප්‍රකාශ කල බවත්, ඒවිට නිලමේ තුමා විසින් ඒම තැටිය පූජා කලේ කවුද කියා විමසූ වි

පූජා කරපු කෙනා ඉන්නේ රට කියල සුජිත් කිව් බවත්, නමුත් නමක් ගමක් සදහන් නොකල බවත්, මෙ සිද්ධියෙන් පසු සමන් ප්‍රියන්ත කපු මහතාගේ මල්ලි වන අජිත් විසින් රත්‍රං තැටියක් දේවාල කාර්‍යාලයට ගෙනැවිත් භාර දී ඇති බවත්, සදහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

iii. <u>ගමාච්චිගේ දමිත් දර්ශණ නිලිනි කැවන්විල, මලිදූව, අකුරැස්ස, රුහුණු මහා කතරගම දේවාලයේ සණකාධිකාරී</u>

මාසයක පමණ කාලයක සිට රුහුණු මහා කතරගම දේවාලයේ පරිපාලන කාර්යාලයේ සණකාධිකාරී වශයෙන් සේවය කරනු ලබයි. පරිපාලන ලේකම් වශයෙන් කටයුතු කරන්නේ ලියන ආරච්චිගේ විමලරත්න මහතායි. මාගේ පත්වීම සදහා ලිපියක් නොමැති අතර රුහුනු මහා කතරගම දේවාලයේ පරිපාලන කාර් යාලයේ රාජකාරි කරන කිසිවෙකුට පත්වීම් ලිපි ලබා දීමක් කරන්නේ නැහැ. 2021.10.26 දින රුහුණු මහා කතරගම දේවාලයේ පරිපාලන කාර්යාලයේසේවය කල බවත්, එදින පරිපාලන ලේකම්ගේ උපදෙස් මත රත්‍රං පැහැති බන්දේසියක් බාර ගැනීම සම්බන්දයෙන් සහභාගි වූ බවත්, එස්.එම් අජිත් පුෂ්ප කුමාර යන අය විසින් බාරදෙන ලද රත්‍රං බන්දේසිය බාරගෙන ඒ සදහා අංක 5296 දරන කුවිතාංසිය ලියා නිකුත් කල බවත්, එම රත්‍රං බංදේසිය බාරදීම සම්බන්දයෙන් ලිපියක් ලබා දෙන ලෙසට ලේකම් තුමා විසින් දැනුම් දුන් විට ඔහුට ලිවීමට නොහැකි බවත්, ලියා දෙන්න අත්සන් කරන්නම් කියා කිව් බවත්, බන් පසු ඔහු කිව් විදියට ලේකම් තුමා ලියුම ලිව් බවත්, ඒ ලියුම ඔහු කියවා බලා ලේකම් මහතා ලවා ලියවා කියවා බැලීමෙන් පසු නිවැරදි බවට අත්සන් කරමි යනුවෙන් ඔහුගේ අත් අකුරින් ලියා අත්සන් කර ඔහුගේ ජාතික හැදුනුම්පත් අංකයද ඔහුගේ අත් අකුරින්ම ලිව් බවත්, සාක්ෂි වශයෙන් තමා සහ ප්‍රධාන ආරක්ෂක නිලධාරී එන්.ඒ වෙලිසන් කුමාර අත්සන් කල බවත්, පුෂ්පකුමාර සමග රත්‍රං තැටිය භාර දීමට තවත් අයෙකු පැමිණ සිටි බවත්, භාරගත් රන් පැහැති බන්දේසිය අගල් 08 ක වට ප්‍රමාණය තිබුනා. උස අගල් 01 නූල් 03කි. ලියවැලක් යොදා තිබුණා. පසුව එම රත්‍රං තැටිය ලේකම් තුමා, තමා සහ ප්‍රධාන ආරක්ෂක නිලධාරී ඉදිරියේ පොලිතින් වලින් හා කොළ වලින් ඔතා ලාකඩ මුද්‍රා තබා සිල් කර බස්නායක නිලමේ තුමාගේ නිල නිවසේ ඇති සේප්පුවේ තැන්පත් කල බවත්, පසුව සේප්පුවේ යතුරත් ලියුම් කවරයක දමා ටේප් ඔතා තමා වෙත භාරදුන් බවත්, එම යතුර දැනට තමා භාරයේ තිබෙන බවටත් සදහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

iv. <u>අම්ල නුවන් මුණසිංහ නො.03, මහ ගෙදර, කතරගම රුහුණු මහා කතරගම දේවාලයේ පත්තිනි දේවාලයේ කපු ධුරන්දර</u>

පියා වන මුණසිංහ මාන්නප්පෙරුමගේ පත්මසේන මුනසිංහ. රුහුනු මහා කතරගම දේවාලයේ පත්තිනි දේවාලයේ කපුවකු වශයෙන් 1981 වර්ශයේදි පත් වූ බවත්, තාත්තා 2009.12.22 දින මිය ගිය බවත්, ඔහු රුහුනු මහා කතරගම දේවාලයේ කපු ධුරන්දර තනතුරට පුහුනු වීම සදහා පෙරහැරේ කටයුතු වලට සහභාගි වූ නමුත් මිය යන විට රුහුනු මහා කතරගම දේවාලයේ කපු ධුරන්දර තනතුර නොලැබුණ නමුත් තාත්තා මිය ගිය පසු වකට බස්නායක නිළමේව සිටි ඩී.පී කුමාරගේ මහතාගෙන් තාත්තාගේ උරුමයට මුණසිංහ පරම්පරාවටත් රුහුනු මහා කතරගම දේවාලයේ කපු ධුරන්දර තනතුරක් ලබා දෙන ලෙසට කල ඉල්ලීම අනුව ලොකු තාත්තගේ දරුවන් වන සමන් ප්‍රියන්ත මුණසිංහ සහ ලලිත් මුණසිංහ යන අයවලුන්ට 2016 මාර්තු 10 දින රුහුනු මහා කතරගම දේවාලයේ කපු ධුරන්දර තනතුර හිමිවූ බවත්, ඒ අනුව මුණසිංහ පරම්පරාවට කපු ධුරන්දර තනතුර හිමිවූ බවත්, තාත්ත මිය ගියාට පසු රුහුනු මහා කතරගම දේවාලයේ පත්තිනි දේවාලයේ කපු ධුරන්දර තනතුරට අයියා වන ජනක පුෂ්පකුමාර මුණසිංහ පත් වූ බවත්, තමාද අයියාගේ සහයට පත්තිනි දේවාලයේ කටයුතු කරන බවත්, තමාගේ නිවසට යාබදව පිහිටා තිබූ රුවන් හෝටලයේ ප්‍රධාන සූපවේදියා වශයෙන් කටයුතු කලේ සුජිත් ප්‍රසන්න බවත්, ඒ නිසා ඔහුව අවු.20 ක පමණ කාලයක සිට අදුනන බවත්, 2019 ජූනි මාසයේ අවසානයේ දී පමණ සුජිත් ප්‍රසන්න විසින් ඔහු හදුනන අයෙකුට රුහුනු මහා කතරගම දේවාලයට රන් භාජනයක් පූජා කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒක කරන පිලිවෙල දන්නෙ නැති නිසා සහයෝගය දෙන්න කියා ඉල්ලා සිටි බවත්, පසුව සුජිත් ප්‍රසන්න 2019.07.03 දින රුහුනු මහා කතරගම දේවාලයට පූජා කිරීමට රත්‍රං බංදේසියක් අරගෙන පත්තිනි දේවලෙයට පැමිණි බවත්, පූජා කිරීමට පැමිනි පිරිස අතර කාන්තාවක් වැඩිහිටි දෙදෙනෙක් සහ කුඩා ළමයෙක් සහ රියදුරු වශයෙන් සිටි කෙනෙක් සිටි බවත්, එය රුහුනු මහා කතරගම දේවාලයට පූජා කිරීමට ප්‍රථම පත්තිනි දේවාලය ඉදිරිපිටදි අයියා වන ජනක පුෂ්පකුමාර මුණසිංහ අතේ තබාගෙන ෆොටෝ ලබා ගත් බවත්, රත්‍රං බංදේසිය අයියාගේ අතේ තිබියදී ලබාගත් ඡායාරූපය ප්‍රකාශ ලබා දෙන අවස්ථාවේ දි හදුනා ගත් බවත්, රත්‍රං බන්දේසිය රුහුනු මහා කතරගම දේවාලයට ඒදිනම දවල් 01.30ට පමණ පූජා කල බවත්, ඒදින සොමිපාල රත්නායක කපු මහතා මාසය භාර කපු මහතා වශයෙන් කටයුතු කල බවත්, සොමිපාල රත්නායක මහතා අතට ඒම රත්‍රං බංදේසිය පූජා කිරීමට භාරදුන් පසු ඒය නැවත දේවාලය තුල තැබීමට දිය කපන කපුරාළ වන උපුල් නිලන්ත සමරකොන් වෙත භාරදුන් බවත්, උපුල් කපු මහතා ඒම බන්දේසිය දේවාලය තුලට රැගෙන ගිය බවත්, පූජා කිරීමට පැමිනි අය ඉන් පසු පිටව ගිය බවත්, ඔවුන් හදුනන්නේ සුජිත් ප්‍රසන්න බවත්, පූජා කරන ලද රත්‍රං බංදේසිය දේවාලයෙන්

(6)

රැගෙන ගොස් ඇති බවට කතාව දැනට සති දෙකකට පමන ඉහතදී සමාජ ජාලා වලින් ප්‍රචාරය වූ බවත්, එය ගබඩාව භාර කපු මහතා වන සමන් ප්‍රියන්ත මුණසිංහ විසින් රැගෙන ගොස් ඇති බවට ප්‍රචාරය වූ බවත්,ප්‍රකාශය ලබා ගන්නා අවස්ථාවේ පෙන්වා සිටි රත්‍රං බන්දේසියේ ජායා රූප සුජිත් ප්‍රසන්න ලග තිබූ බවත්, සුජිත් ප්‍රසන්න ගෙන් ඒම ජායාරූ දිය කපන කපු මහතා වන උපුල් නිශාන්ත සමරකෝන් ඉල්ලා ගත් බව සුජිත් කියා සි බවත්, එම ජායාරූප ෆේස්බුක් ඒකේ යන්නේ ඇයි කියා සුජිත්ගෙන් විමසූ විට උපුල් කපු මහත්තයට දුන්නට පස්සේ තමයි ඒහෙම වුනේ කියා කිව් බවත්, මේ සිද්ධියෙන් පස්සේ බස්නායක නිළමේ වන ධිශාන් ගුණසේකර මහතා පැමිණ තමාත් සුජිත් ප්‍රසන්නත්, මාසය භාර කපුමහතා වූ සරත් සේපාල රත්නායකත්, දිය කපන කපුරාල වන උපුල් ද කැදවා ඒක් ඒක් අයගෙන් වෙන් වෙන් වශයෙන් නිළමේ තුමා කරුණු විමසා සි බවත්, තමාගෙන් විමසීමේදී ඉහත කී ආකාරයට රත්‍රං බංදේසිය පූජා කල ආකරය ගැන කියා සිටි බවත්, ඊට පසුව ගබඩාව බාර කපු මහතා වන සමන් ප්‍රියන්ත මුණසිංහගේ මල්ලී වන ඒම්.ඒම්.අජිත් පුෂ්පකුමාර මුණසිංහ විසින් සොම්පාල මහත්තය දුන්න රත්‍රං බංදේසිය වලව්වට භාරදෙන්න යාමට කථා කල බවත්, එසේ කී විට තමා කලින් සදහන් කල දේවාලයටපූජා කල රත්‍රං බංදේසිය තමයි මේ භාරදෙන්න යන්නේ කියා දැන ගත් බවත්, අජිත් පුෂ්පකුමාර සොම්පාල රත්නායක මහතාගේ ගෙදරට ගොස් රත්‍රං බංදේසිය රෙ කැල්ලක ඔතාගෙන ඉටි බෑග් ඒකක දාගෙන අරගෙන මෝට බයික් ඒකෙන් තමාගේ දේ ලගට පැමිණි බවත්, තමා එය බැලුවේ නැති බවත්, පසුව බයික් ඒකේ අජිත් ඒක්ක දේවාලයට ඇවිත් අජිත් ලේඛම් මහත්තයට රත්‍රං බන්දේසිය බාරදුන් බවත්, ඒ අවස්තාවේ තමාත්,අජිත්,ලේකම් තුමා, සිකියුටිත්, තවත් දේවාලයේ කාර්යාලයේ අයෙකුත් සහ සරත් සේපාල රත්නායක කපු මහතාත් සිටි බවත්, භාරදෙන වෙලාවේ රත්‍රං බංදේසිය හදුනාගත් බවත්, එය සුජිත් ප්‍රසන්නගේ මැදිහත් වීම මත තමා ඉහතින් සදහන් කල 2019.07.03 රුහුනු මහා කතරගම දේවාලයට පූජා කල රත්‍රං බංදේසිය බවට හදුනා ගත් බවත්, රත්‍රං බංදේසිය භාරදෙන අවස්ථාවේ ලේඛම් තුමා විසින් අජිත්ගෙන් ලිපියක් ඉල්ලා සිටි වි අජිත් විසින් ලේඛම් තුමාම ලියන්න කියා අජිත් කිව් විස්තරය අනුව ලේකම් තුමා ලියුම් ලිව් බවත්, අජිත් ඒ ලියුම ඒ ලියුම කියවල බලල අජිත් විසින් අත්සන් කල බවත්, සදහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

v. <u>දිසානායක මොහොට්ටිලාගේ සුජිත් ප්‍රසන්න සුමන නිවස, රෝහල පිටුපස, නව නගරය කතරගම, අරක්කැමි</u>

අවුරුදු 20 ක් පමණ 2018 අවුරුද්ද දක්වා කතරගම රුවන් හෝටලයේ අරක්කැමි වශයෙන් කටයුතු කර ඇත. රුවන් හෝටලයේ වැඩ කරන කාලයේදි 2019 අවුරුද්දේ රුවන් හෝටලයට පැමිණි නෝනා කෙනෙක් කතරගම දේවාලයට රත්‍රං පැන් භාජනයක් පූජා කරන්න භාර ගත් බවත්, එයට ඒකට උදවු කරන්න කියා ඉල්ලා සිටි නිසා ඒ සදහා උදව් කල බවත්, පත්තිනි දේවාලයේ අම්ලට ඒ බව කියා අම්ලගේ ද උදව් ඇති 2019.07.03 දින රත්‍රං පැන් භාජනයක් පූජා කරන්න පොරෝන්දු වුන නෝනා ඒයාගේ බබත් තවත් නෝනලා දෙන්නෙකුත් ඩ්‍රයිවරුත් ඒක්ක වෑන් ඒකකින් පැමිණි පසු ඔවුන් සමග කිරි වෙහෙරට ගොස් පසුව රුහුණු මහා කතරගම දේවාලයට රත්‍රං තැටිය පූජා කල බවත්, පැන් භාජනය භාර ගත්තේ සොම්පාල රත්නායක යන ලොකු කපු මහත්තයා බවත්, ඊට පස්සේ දේවාලය ඇතුලේ හිටපු දියකපන උපුල් කපු රාළ දේවාලය ඇතුළට අරගෙන ගියා බවත්, ඒ රත්‍රං පැන් භාජනයේ පූජා කරන දිනය සහ නමක් කොටා තිබූ බවත්, පූජා කිරිමට පෙර ජායාරූප ගත් බවත්, තවත් ජායාරූප පූජා කිරිමට පැමිණි නෝනා දූරකථනයට එවූ බවත්, ගිය මාසයේ 07 වෙනිදා ඉදලා දවස් 14 ක් විතර දේවාලයේ සර්කිට් ඒකේ මම ඉහුම් පිහුම් කටයුතු කල බවත්, ඒ අතරේ දවසක දියකපන උපුල් කපු රාළට එම රත්‍රං තැටිය අදාල ෆෝන් ඒකේ තිබුන ජයාරූප පෙන්වා එය එම ජයාරූප ඔහුට ද ලබා දී දෙවාලය තුල එම තැටිය තිබෙනවා ද කියා සොයන ලෙසට දැනුම් දුන් බවත්, ඉන් පසුව උපුල් කපු රාළ විසින් දොවලය තුල එම රන් තැටිය නොමැති බව දැන්වූ බවත්, උපුල් කපු මහතාට දුන් ජායාරූප පසුව ෆේස්බුක් වල ප්‍රචාරය වූ බවත් පසු මේ පිළිබදව දියවඩන නිළමේ තුමාද ගෙනැවිත් විමනසූ බවත්, ජායාරූප සහිත ජංගම දූරකථනය ප්‍රකාශ ලබා දෙන අවස්ථාව වන විට අලූත් වැඩියාවට ලබා දී ඇති බවත් සදහන් කරමින් 2021.11.02 දින ප්‍රකාශය ලබා දී ඇත.

නැවත 2021.11.17 දින කැදවා රත්‍රං තැටිය පූජා කරන අවස්ථාවේ ජායාරූප ගත් ජංගම දූරකථනය ද පරික්ෂා කර ප්‍රශ්ණ කිරීමෙන් පසු ප්‍රකාශ ලබා ගත් අවස්ථාවේ දි කලින් ප්‍රකාශයේ පරිදි පැමිණි නෝනා වෙත ජංගම දූරකථන අංකය ලබා දිමෙන් එදින අංගොඩ ලොක්කා යන අය ඉමෝ හරහා තමාට කථා කර දේවාලයට රත්‍රං තැටියක් පූජා කිරීමට සාදා දෙන ලෙසට ඉල්ලා සිටි බවත්, අංගොඩ ලොක්කා දූරකථනයෙන් දැනුම් දුන් ආකාරයට කඩුවෙලට ගිය පසු අංගොඩ ලොක්ක විසින් එවන ලද නාඳුනන පුද්ගලයන් දෙදෙනා විසින් ගෙනවිත් දුන් රත්‍රං බිස්කට් ලබා ගෙන ඒවා ගෙනැවිත් කතරගම රත්‍රං බඩු සාදන මාලන් වෙත ලබා දී රත්‍රං තැටියක් සාදාගෙන ඉන් පසු එම රත්‍රං තැටිය 2019.07.03 දින පත්තිනි දේවාලයේ අම්ලගේ සහය ඇතිව රුහුණු මහා කතරගම දේවාලයට එය පූජා කිරිමට පැමිණි නෝනා මගින් එය පූජා කල බවත්, ඒ පූජාව කළ ප්‍රධාන කපු මහතා වන සොම්පාල වී රත්නායක මහතා වන බවත්, පූජා කල පසු උපු

කපු මහතා එය දේවාලය තුලට ගෙන ගිය බවත් අංගොඩ ලොක්කා ලබා දුන් රත්‍රං බිස්කට් මාලන්ට ලබා දීමට ප්‍රථම තම ජංගම දුරකථනයත් ෆොටෝ ගත් බවත් රත්‍රං තැටිය සෑදූ පසු පූජාකිරීමට පෙර ජංගම දුරකථනයෙන් ඡායාරූප ගත් බවත්, එම සියළු ඡායාරූප දැනට ද ජංගම දුරකථනයේ තිබෙන බවත්, පූජා කිරීමට පැමිණි කාන්තාව සහ අනිත් අය පිළිබඳව තොරතුරු නොදන්නා බවත්, මේ සඳහා අංගොඩ ලොක්කා වියදමට තමාගේ කොමර්ෂල් බැංකු ගිණුමට ලක්ෂ 02 ක මුදලක් එවා තිබූ බවත්, කලින් ප්‍රකාශයේ දී අංගොඩ ලොක්කා මෙයට සම්බන්ධ වූ නිසා ඇති වූ බියට ඒ ගැන ප්‍රකාශ නොකල බවත් මේ සිද්ධිය පිළිබඳව කථා කිරීමට බස්නායක නිළමේ තුමා කෝල් කර දේවාලයට එන්න කියා දැන්වූ පසු සෝමපාල කපු මහතා හමු වන ලෙසට අම්ල අත පණිවිඩයක් එවා තිබූ නිසා අම්ල සමග ගොස් සෝමපාල කපු මහතාගේ ගෙදර දී ඔහු හමු වූ බවත්, ඒ අවස්ථාවේ සෝමපාල කපු මහතා විසින් රත්‍රං තැටිය පූජා කරපු අය දවස් 03 ක් දේවාලයේ තැබූ පසු ඒ අය ආපසු ඇවිත් රත්‍රං තැටිය අරගෙන ගියා කියා බස්නායක නිළමෙට කියන ලෙසට කිව් බවත්, අම්ලත් ඒ වෙලාවේ සිටි බවත්, ඊට පසුව බස්නායක නිළමේ තුමා හමු වූ වලාවේ ඒ ආකාරයට කිව් බවත්, සඳහන් කරමින් ඡායාරූප ඇතුලත් ජංගම දුරකථනය ද ලබා දී ප්‍රකාශ ලබා දී ඇත.

vi. <u>කෝනාර මුදියංසේලාගේ උපුල් නිලන්ත සමරකෝන් සුමිහිරි උඩබුබුල, බිබිල, රුහුණු මහා කතරගම දේවාලයේ දියකපන කපු ධුරන්දර</u>

රුහුණු මහා කතරගම දේවාලයේ දිය කපන කපු ධුරන්දර වශයෙන් වසර 38 ක් පමණ සේවය කල තම පියා 2019 වසරේදී මිය ගිය පසු එදින සිට මේ දක්වා රුහුණු මහා කතරගම දේවාලයයේ දිය කපන කපු ධුරන්දර වශයෙන් කටයුතු කරන බවත්, ප්‍රකාශය ලබා දෙන දිනට සති දෙකකට පමණ ඉහතදී දේවාලයේ ඉවුම් පිහුම් කටයුතු කිරීමට සුජිත් ප්‍රසන්න යන අය පැමිනි බවත්, දේවාලයේ ඉවුම් පිහුම් කටයුතු කල දිනක ඔහුගේ ෆෝන් එකේ තිබුනු රත්‍රං බංදේසියක ෆොටෝ වගයක් පෙන්වා එය පූජා කලේ ඔහු දන්න නෝනා කෙනෙක් බවත්, එය දේවාලයේ තිබෙනවා ද කියා සොයා බලන ලෙසට දැනුම් දී එම ෆොටෝ තමාගේ ජංගම දුරකථනයට එවූ බවත් පසුව ඒ පිළිබඳව සොයා ෆොටෝ වල සඳහන් පරිදි රත්‍රං තැටියක් දේවාල මාළිගාවේ නොමැති බවට දැන්වූ බවත් පසුව මී පිළිබඳව සමාජ ජාලා ඔස්සේ ද ප්‍රචාරය වූ බවත් මෙම රත්‍රං තැටිය සොම්පාල ටී රත්නායක මහතා විසින් දේවාලය තුල තැබීමට තමා වෙත භාර නොදුන් බවත්, සඳහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

vii. <u>මුණසිංහ මාන්නප්පෙරුමගේ ජනක පුෂ්පකුමාර අංක 535, දූ.ජී.ප්‍රේමදාස මාවත, පෙරගෙඩිගම ,කතරගම, රුහුණු මහා කතරගම දේවාලයේ පත්තිනි දේවාලයේ කපු ධුරන්ධර</u>

රුහුණු මහා කතරගම දේවාලයේ පත්තිනි දේවාලයේ කපු තනතුරේ කටයුතු කරන බවත්, 2019.07.03 දින සුජිත් ප්‍රසන්න යන අය පත්තිනි දේවාලයට තවත් කට්ටියක් සමග පැමිනි බවත්, ඒ අතර නෝනා කෙනෙකුත්, පොඩි ළමයෙකුත් , තවත් කාන්තාවන් දෙදෙනෙකුත් සිටි බවත්, ඒ අය පැමිණ තිබුනේ රුහුණු මහා කතරගම දේවාලයට රත්‍රං බන්දේසියක් පූජා කිරීමට බවත්, දේවාලයට පූජා කිරීමට ප්‍රථම ඒ බන්දේසිය මගේ අත තබා ගෙන සුජිත්ගේ ෆොන් එකෙන් ෆොටෝ සුජිත් විසින් ලබා ගත් බවත් , එම ෆොටෝ ප්‍රකාශ ලබා දෙන අවස්ථාවේ හඳුනා ගත් බවත්, 2021.11.02 දින හඳුනා ගත්තේ 2019.07.03 දින පූජා කිරීමට රැගෙන ආ බන්දේසිය බවත්, සඳහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

viii. <u>මුණසිංහ මාන්නප්පෙරුමගේ අජිත් පුෂ්පකුමාර නො.13 ,මහගෙදර, කරවිලය, සෙල්ල කතරගම,ව්‍යාපාරික</u>

රැකියාව වශයෙන් ගොවිතැන් කටයුතු වල සහ ආපන ශාලාවක් පවත්වාගෙන යන බවත්, ඊට අමතරව රුහුණු මහා කතරගම දේවාලයේ මාසික තේවාවන් වල වැඩ කිරීම සඳහා සහභාගි වන බවත්, ප්‍රකාශය ලබා දුන් දිනට සති දෙකකට පමණ ඉහතදී රුහුණු මහා කතරගම දේවාලයට පූජා කර තිබූ රත්‍රං මල් වට්ටියක් සොරකම් කර ඇති බවට ෆේස්බුක් ඔස්සේ ප්‍රචාරය වූ බවත්, එයට අයියා වන සමන් ප්‍රියන්ත කපු මහතාත් සම්බන්ද බවට ප්‍රචාරය වූ බවත්, තවද සොම්පාල රත්නායක ප්‍රධාන කපු මහතාද සම්බන්ද බවට ප්‍රචාරය වූ බවත්, ඒ ගැන අයියගෙන් ඇසූ අවස්ථාවේ නැති වෙන්න විදියක් නැහැ මුත්ත ලග ඇති බවට කිව් බවත්, මුත්ත කියල කියන්නේ සොම්පාල රත්නායක ප්‍රදාන කපු මහතාට බවත්, මේ කතාව තියෙද්දි 2021.10.26 දින උදේ කුඹුරට යාමට කලින් උදේ 09.00 ට විතර මුත්ත කෝල කර ලේඛම් මහත්තයට කොල් එකක් දී තිබෙන බවත්, රත්‍රං මල් වට්ටිය අරගෙන ගිහිල්ල ලේඛම් මහත්තයට භාරදෙන්න කියා කිව් බවත්, පසුව කුඹුරට ගොස් වැඩ කර ගෙදර ආ පසු ෆෝන් එකේ මුත්තගෙන් මිස්කොල් 02 ක් තිබූ බවත්, නැවත මුත්ත කෝල් කර රත්‍රං මල්වට්ටිය දැන්ම ලේකම් මහත්තයට ගිහින් දෙන්න කියා කිව් බවත්, පස්සේ පසිඳුත් එක්ක මෝට බයික් එකේ සවස 01.30 විතර මුත්තගේ ගෙදරට ගිය බවත්, රතු පාට රෙදි කැල්ලක ඔතපු රත්‍රං මල්වට්ටිය සුදුපාට ව්‍යූලිප් බෑග් එකක දා තිබූ බවත්, ඒ බෑග් ඒක මුත්ත ලබා දී ලේකම් මහත්තයට දෙන්න කියා කිව් බවත්, ඒ වෙලාවේ පසිදුද එතන සිටි බවත්, ඒ බෑග් එකත් අරගෙන පසිඳුත් එක්ක දේවාලයට එන්න පිටත් වූ බවත්, එන අතරෙදී පසිදුට කොල් එකක් ඇවිත් පසිදු ගෙදර යන්න ඕන කියා කිව් බවත්, පසිදු ගෙදර ලගින් බස්සවා බාප්ගෙ පුතා අම්ලට කොල් කර අම්ල යටග

දෙවාලයට ගොස් ලේඛම් මහත්තයට මුත්ත දුන්න බැග් ඒක බාර දුන් බවත්, එයට ... 5296 රිසිට් පතක් ලබා ගත් බවත්, භාර දීම සම්බන්ධයෙන් ලේඛම් මහතා ලියූ ලිපි... කියවා බලා අත්සන් කල බවත්, රිසිට් එක තමාගේ නමට ලිව්මට හදන විට රත්‍රං ... වට්ටියේ සදහන් නමට ලියන ලෙසට දැනුම් දුන් බවත්, සදහන් කරමින් ප්‍රකාශ ලබා ... ඇත.

ix. <u>සොම්පාල තිමලත් රත්නායක කිරිවෙහෙර පාර, නව කතරගම රුහුනු මහා කතරගම දේවාලයේ ප්‍රධාන කපු ධුරන්දර</u>

1975 වර්ශයේ පියා මිය ගිය පසු එම වර්ශයේ සිට රුහුණු මහා කතරගම දේවාලයේ ප්‍රධාන කපු ධුරන්දර තනතුර දරන බවත්, 2019 අවුරුද්දේ පෙරහැර මාසෙ දේවාලයට මල් පූජා කිරිමට රත්‍රං පැහැති බංදේසියක් ගබඩාරාල වශයෙන් කටයුතු කරන සමන් ප්‍රියන්ත ... මහත්තය අරගෙ පැමිණි බවත්, ඒවන විට දේවාලයේ මල් පූජා කිරිම සදහා පවුම් 50 ... සාදන ලද 1959 අවුරුද්දේදී බස්නායක නිලමේ කෙනෙක් වශයෙන් සිටි විල්... රත්වත්තේ මහතා විසින් දේවාලයට පූජා කරපු රත්‍රං බංදේසියක් තිබු බවත්, එම බංදේ... ඒදා සිට මල් පූජා කල බවත්, ඒ බංදේසිය භාවිතා නොකර වෙනත් රත්‍රං බංදේසිය... පාවිච්චි කිරීමට අවශ්‍ය නොවූ බවත්, ඒනිසා ගබඩා රාල වන සමන් ප්‍රියන්තට ... බන්දේසිය දේවාලයට අවශ්‍ය නොවන කියු බවත්, බන්දේසිය ගෙන ආ දවසෙම ගබඩා රාල ඒ බන්දේසිය රැගෙන ගිය බවත්, ඊට පසු ඒ ගැන සොයා නොබැලූ බව... 2021.10.19 දින කටගමුවේ බංගලාවේ සිටින අවස්ථාවේ දිය කපන උපුල් කපු මහත්ත... කොල් කර උයන්න ආපු කොකියා කියවනවා ඒයා රත්‍රං ගෙනල්ල රත්රං වේ‍ර ඒක... හැදවල වුටි කපු මහත්තයට බාරදුන්නා ඒකට මොනව උනාද දන්නෙ නෑ කියල කියව... බවත්, ඒ කතාව බස්නායක නිලමෙ තුමාටත් ආරංචි වි බස්නායක නිලමෙ තුමා වුටි ... මහත්තයත්, රාලහාමි කපු මහත්තයත් උපුල් කපු මහත්තයත් ගෙන්නල ඒ ගැන ... කල බවත්, ඒහෙම තියෙන අතුර තුරේදී ෆේස්බුක් වල ද ප්‍රචාරය වී තිබු බවත්, බස්නායක නිලමේ තුමා දේවාලයේ තිබුන රත්‍රං බංදේසිය ගැන සිදූ වීමක් තියනවා ඒක බස්නායක නිලමෙට,දේවාලෙට හා කපු මහත්තුරුන්ට අපකීර්තියක් ඒක නිසා කපු මහත්වුරු ගෙනැල්ල මේක ගැන සාකච්චා කරල තීරනයක් ගන්න ඕනි කියා කිව් බවත්, එව... ඔක්කකොම කපු මහත්තුරු ගෙන්නන්න බැරි නිසා රාලහාමි කපු මහත්තයයි, උපුල් කපු මහත්තයයි කැදවූ බවත්, මේක දුරදිග ගෙනියන්නෙ නැතුව සාකච්චා කරල තීරනයක් ග... කියා කථා වු බවත්, ඊට පස්සේ වුටි කපු මහත්තය විසින් රත්‍රං බංදේසිය හදලා දෙනව... කියා ඇති බවට ආරංචි වු බවත්, නිලමෙතුමත් බංදේසිය හදලා ගෙනත් තිබ්බම මේ... ... කරමු කියා කිව් බවත්, වුටි කපු මහත්තයා රත්‍රං බංදේසිය හදලා දෙනව ... ඒක බස්නායක නිලමෙට බාරදෙන්න කියලා කියන්න වුටි කපු මහත්තයට කෝල් ... බවත්, එවිට වුටි කපු මහත්තය තාම හදනවා කියා කිව් බවත්, ඊට පස්සෙ නැවතත් වුටි කපු මහත්තයට කොල් කලද ආන්සර් නොකල බවත්, ඒක නිසා වුටි ... මහත්තයාගේ මල්ලි වන අජිත්ට කොල් කල විට දැන් මේ බංදේසිය ගේන්න යන ගමන් කියා කිව් බවත්, <u>එවිට මම ඔන්න දැන් ලේඛම් මහත්තයා ඉන්නවා බාර දීල රිසිට් එක ගන්න කියා කිව් බවත්,</u> ඒ 2021.10.26 දින වන බවත්, ඒහෙම කියලා ගෙද... ඉන්නකොට වුටි කපු මහත්තයාගෙ මල්ලි අජිත් තවත් දෙන්නෙක් ඒක්ක ඇවිත් ඉන්නව... ...ලා ගෝලයා වන රාජා කිව් බවත්, ඒවෙලාවේ නිදාගෙන සිටි බවත්, වෙලාව ... 02 ට 02.30 ට විතර පමණ වු බවත්, බංදේසිය අරගෙන ගිහිල්ලා ලේඛම්ට භාරදෙ... කියල කියන්න කියා රාජාට කිව් බවත්, ඒහෙම කියලා ලේකම්ටත් බන්දේසිය අරගෙන ඇවිල්ලා තියෙන්නේ ඒක බාරගෙන රිසිට් ඒක්ක දෙන්න කියා කිව් බවත්, අජිත් බංදේසි... බාරදෙන්න ආවට පස්සේ දෙවාලයේ ඉදලා කෝල් කරල ලේඛම් තුමා රිසිට් ඒක... ඉල්ලනවා ඒක දෙන්න හොදද කියල ඇසූ බවත්, රිසිට් ඒක්ක දීල භාර දෙන්න කියා කි... බවත්, ඒ විදිහට සුජිත්, ලේකම් තුමාට බංදේසිය භාරදී තිබුණ බවත්, සුජිත් දේවාලය... බංදේසිය බාරදෙන්න කලින් තමාගේ ගෙදරට ඇවිත් තිබෙන බවත්, බංදේසිය සුජි... බාරදුන්න බව ලේකම් තුමා කිව් බවත්, දේවාලයට බැතිමතුන් පූජා කරන භාන්ඩ හා මුද... මාසයේ තේවාව කරන කපු මහත්වුරුන්ට අයිති වන බවත්, ඒත් වටිනා කම වැඩි රත්‍ර... භාණ්ඩ දේවාල මාලිගාවේ තැබිය යුතු වන බවත්, සදහන් කරමින් ප්‍රකාශයක් ලබා ... ඇත.

x. <u>සෙල්වරාජ් විග්නේශ්වරන් නොහොත් රාජා අක්කර 50, ගාඩිමෝර් වත්ත,මස්කෙලි... මෙහෙකරු</u>

දැනට මාස 08 ක පමණ කාලයක සිට කතරගම දේවාලයේ ප්‍රධාන කපු මහත්තයාගේ ගෙදර වැඩ කරන බවත්, කපු මහත්තයාගේ නම සොම්පාල රත්නායක බවත්, අජිත් ය... අය හදුනන බවත්, අජිත් යන අය තුන් වතාවක් පමණ ප්‍රධාන කපු මහතාගේ ගෙදර පැමිණ ඇති බවත්, ප්‍රකාශය ලබා දුන් දිනට සතියකට කලින් ඉස්සේල්ලාම තව... කෙනෙක් ඒක්ක මෝටර් බයිසිකලයෙන් පැමිණි බවත්, ඒවිට වේලාව හවස 04 ට විතර ... බවත්, ඔහු මහත්තයා හම්බෙන්න ආවා කියා කිව් බවත්, මහත්තයට ඒ ගැන කියන්න ගි... වේලාවේ මහත්තයා නිදාගෙන නැගිටලා සිටි බවත්, අජිත් ඇවිත් ඉන්නවා කියා කිව් වි... මෙහෙ ගේන්න ඒපා ගිහිල්ලා දේවාලයට භාර දෙන්න කියලා කියන්න කිව් බවත්, ඊ... පස්සේ අජිත්ට ඒහෙම කිව් බවත්, අජිත් ආපු ඒක්කෙනත් ඒක්ක යන්න ගිය බවත්, අජි...

ඒක්ක ආපු අනිත් කෙනා කවුද කියලා අඳුරන්නේ නැති බවත්, අපිත්ගේ අතේ තැඹිල් පාට විශුලිප් බෑග් එකක් තිබුන බවත්, බෑග් එක දෙකට නවලා තියාගෙන සිටි බවත්, ඊට පසු දැනට දවස් 04 කට විතර කලින් මුලින් සදහන් කල අයත් ඒක්කම හවස 04.00 ට පමණ ආ බවත්, එදා ඔහු මහත්තයත් ඒක්ක විනාඩි 10 ක් 20 ක් විතර කතා කර කර ඉදලා ගිය බවත්, ඊට පස්සේ අපිත් ආවේ අද උදේ 10ට විතර පැමිණ මහත්තයත් ඒක්ක විනාඩි 10 ක් 20 ක් විතර කතා කර කර ඉදලා ගිය බවත් සදහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

xi. <u>මුණසිංහ මාන්නප්පෙරුමගේ සමන් ප්‍රියන්ත නොහොත් වුට් කපු මහතා අංක 02, සෙල්ලපාර, කතරගම රුහුනු මහා කතරගම දේවාලයේ කපු ධුරන්දර</u>

රුහුණු මහා කතරගම දේවාලයේ ගබඩාව භාර කපු ධුරන්දර තනතුර දරන බවත්, එසේ 2017 වසරේ සිට සේවය කරන බවත්, කපු මහතෙකුට දේවාලයේ තේවාව සදහා මාසය බැගින් වෙන් කර දෙනු ලබන බවත්, තමාටද ඒක් මාසයක් හිමි වන බවත්, දේවාල මාලිගාවට ඇතුලුවිය හැක්කේ කපු ධුරන්ධර දරණ 15 දෙනාට සහ බස්නායක නිලමේ තුමාට පමණක් බවත්, 2019 හත්වන මාසයේ තේවා කටයුතු පවත්වාගෙන යාම සදහා 2019.07.03 වන දින දේවාලයේ යතුරු ප්‍රධාන කපු මහතා වන සොමිපාල වී රත්නායක මහතා වෙත ඊට කලින් මාසයේ තේවාව භාරව සිටි ලලිත් රත්නායක කපු මහතාගෙන් භාරගෙන භාරදෙනු ලැබු බවත්, ඒ සම්බන්ධයෙන් දින පොතෙහි සටහන් තබා අත්සන් අරගෙන තිබෙන බවත්, ඒ ආකාරයට සෑම මසකම දේවාලයේ යතුරු භාර දිම පිළිබදව දින පොතෙහි සටහන් තබන බවත්, 2019.07.03 දින සොමිපාල වී රත්නායක මහතාට දේවාලයේ යතුර භාර දිම පිලිබදව ඩයිරියේ තබන ලද සටහනේ පිටපතක් අත්සන් කර මා දැන් පොලිසියට භාර දෙන බවත්, 2019.07.03 දේවාලයේ ගබඩාවේ පෙරහැරේ ගමන් කරන අලි ඇතුන්ට අන්දන්න ඇදුම් සහ පන්දම් හදමින් සිටි බවත්, එදා දවල් 12.30 ට විතර පත්තිනි දේවලයේ අම්ලයි, රෙස්ට් වල උයන සුජිත් හා තවත් පිරිමි දෙන්නෙක් පැමිණි බවත්, අම්ල ඇවිත් වුට් අයියේ කියා කතා කල බවත්, ඔවුන් ලගට යන විට සොමිපාල රත්නායක කපු මහත්තයත් දේවාලේ තිරේ ලග පඩිය ලග තියෙන ගැටයේ වාඩිවෙලා සටි බවත්, අම්ල විසින් රත්‍රං බන්දේසියක් පූජා කරන්න ආවේ කියා කිව් බවත්, මුන්නටත් ඒහෙම කිව් බවත්, මුන්නා විසින් උපුල් කපු මහත්තයට දෙන්න කියා දෙන්න කියා කිව් බවත්, පූජා කරන්න ආපු පිරිමි දෙන්නාගෙන් රත්‍රං බන්දේසිය අරගෙන අම්ල විසින් උපුල් කපු මහත්තයට දුන් බවත්, උපුල් කපු මහත්තයා ඒ බන්දේසිය අරගෙන දේවාල මාලිගාව ඇතුලට ගිය බවත්, පිරිමි දෙන්නාත් ඒක්ක තවත් කාන්තාවෝ ආවද කියන්න දැක්කේ නැති බවත්, පෙරහැර දවස් නිසා සෙනග සිටි බවත්, ඒහෙම පූජා කරාට පස්සේ ඒ බන්දේසිය මාලිගාවේ සති 02 ක් විතර තිබුනාට පස්සේ සොමිපාල වී රත්නායක මහත්තයා විසින් හම්බවෙච්ච බන්දේසිය කාමරයෙන් ගිහින් තියන්න කියා කිව් බවත්, එවිට ඒ අම්ල කට්ටියත් එක්ක ඇවිල්ලා පූජා කරපු බන්දේසිය ගැන තමයි කිව්වේ කියල දැන ගත් බවත්, ඒ බන්දේසිය දේවාලයෙන් අරගෙන ගිහිල්ලා මාසේ භාර කපු මහත්තයට ඉන්න තියෙන කාමරයේ සොමිපාල කපු මහත්තයා ඉද්දි මේසේ උඩින් තැබු බවත්, ඒ වේලාවේ සොමිපාල කපු මහත්තයගේ කකුල් දෙක මිරික මිරික කන්දා සිටි බවත්, මින්දත් බන්දේසිය ගිහින් මේසේ උඩ තියෙනවා දුටු බවත්, කන්දා කියන්නේ දේවාලයේ මුළුතැන් උයන කෙනාට බවත්, ඒ බන්දේසිය දේවලේ ඇතුලේ තියෙන දවස් වල මලුත් පූජා කල බවත්, බන්දේසිය පිටිපස්සේ නමක් සදහන් කරලා පූජා කරමි කියලා ලියලා තිබු බවත්, ඒහෙම ලියලා තිබුනේ ඉදිකට්ටක් වගේ තුඩක් තියෙන ඒකකින් බවත්, තව මලක් වගේ කැටයමක් තිබුනා මතක බවත්, දැනට සති දෙකකට විතර කලින් කොළඹ ඉන්න දම්මික මහත්තයා කෝල් කරලා දේවාලයට සම්බන්ධ රත්‍රං බන්දේසියක් වුට් මහත්තයා ගත්තා කියලා ෆෙස් බුක් එකේ දාලා තියෙනවා කියලා කිව් බවත්, එවිට ඒ ගැන නොදන්නා බව දම්මික මහත්තයට කිව් බවත්, වරදක් කරපු නැති නිසා පාඩුවේ සිටි බවත්, දම්මික මහත්තයා පණිවිඩේ කියලා දවස් දෙක තුනකට පස්සේ බස්නායක නිලමේ තුමා වලව්වට එන්න කියා කිවු නිසා නිළමේ තුමා හමු වු බවත්, ඒ වේලාවේ රාළහාමි කපු මහත්තයත් සිටි බවත්, මැට් කාමරයට රාළහාමි කපු මහත්තයාව ඒකකගෙන ඇවිත් රාළහාමි කපු මහත්තයගේ කකුල් දෙක අල්ලලා වැදලා මම මේක අරගත්තේ නැහැ, අරගෙන විකුණලත් නැහැ, සෝමිපාල මුත්තගේ මාසයෙදි තමයි මේක හම්බුනේ කියලා කිව් බවත්, නිළමේතුමාටත් රත්‍රං බන්දේසිය මුත්තාගේ කාමරයේ මේස උඩින් තිබ්බ කතාව කිව් බවත්, ඊට පස්සේ නිළමේ තුමා කට්ටියටම මේක හොද නැහැ පත්තර වල යන්න කලින් මේක කට්ටියත් ඒක්ක සාකච්චා කරලා බලන්න කියා කිව් බවත්, ඊට පස්සේ මුත්තගේ ගෙදරට අම්ලත් ඒක්ක ගිය බවත්, මුත්තේ මේක නැත්නම් ඒක හදන්න මුත්තට සල්ලි හරි ඔනෙනම් දෙන්නම් කියලා කිව් බවත්, ඒහෙම කිව්වේ මුත්තට තියෙන ආදරය නිසා වන බවත්, මුත්තට මම සල්ලි ඔනෙනම් දෙන්නම් කිව්වම මුත්තා පලයන් පකයා යන්න කියලා බැන්න බවත්, අම්ල මේ සිද්ධිය අහගෙන සිටි බවත්, ඊට පස්සේ මුත්තත් ඒක්ක කතා නොකල බවත්, මල්ලි වන අජිත් පුෂ්පකුමාර රත්‍රං බන්දේසියක් දේවාලයේ පරිපාලන ලේඛම් වෙත 2021.10.26 දින භාරදුන් බව එදා රෑ 09 ට විතර මල්ලි කිව් පසු දැන ගත් බවත්, සදහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

xii. <u>මුත්තුසාමි කන්දසාමි අංක 143, සමෘද්ධි මාවත, නාගහවීදිය, කතරගම කතරගම දේවාලයේ මුළුතැන්ගෙහි අරක්කැමි</u>

1968 වර්ෂයේ සිට මේ දක්වා මා රුහුණු මහා කතරගම දේවාලයේ සේවය කරන බවත්,
මුරුතැන් පූජාව සඳහා මුරුතැන් බත් ඉව්ංම කටයුතු සිදු කරන බවත්, රුහුණු මහා
කතරගම දේවාලයේ බස්නායක නිළමේ වශයෙන් කටයුතු කරන්නේ ඩිෂාන් වික්‍රමරත්න
ගුණසේකර මහතා බවත්, ප්‍රධාන කපු මහතා වන්නේ සොම්පාල වී රත්නායක මහත
බවත්, රුහුණු මහා දේවාලයේ තේවාව කරන තවත් කපු මහතුන් 12 ක් 13 ක් පමණ
සිටින බවත්, බස්නායක නිළමේ මහතාට සහ තේවාව කරන කපු මහතුන්ට පමණ
දේවාල මාලිගාව තුලට යා හැකි බවත්, සෝමපාල වී රත්නායක ප්‍රධාන කපු මහතා සමඟ
බොහෝම හිතවත් බවත්, තේවාව කරන කපු මහතුන්ට මාසයේ තේවාව සඳහා නැවතී
සිටීමට දේවාලයේ වෙනමම නිළ කාමරයක් තිබෙන බවත්, මාසයේ තේවාව භාර කපු
මහතා එම මාසයේ රැඳී සිටින්නේ ඒ නිළ කාමරයේ බවත්, රුහුණු මහා කතරගම
දේවාලයේ ඇසළ පෙරහැර පවත්වන මාසයේදී තේවාව භාරව කටයුතු කරන්නේ
අනිවාර්යයෙන්ම සෝමපාල වී රත්නායක ප්‍රධාන කපු මහත්තයා බවත්, 2019 ජූලි මාස
කියන්නෙත් රුහුණු මහා කතරගම දේවාලයේ ඇසළ පෙරහැර පැවති මාසය බවත්,
මාසයේ තේවාව භාරව කටයුතු කලෙත් සෝමපාල වී රත්නායක ප්‍රධාන කපු මහත්තය
බවත්, චූටි කපු මහත්තයා කියන්නේ ගබඩා රාළ වශයෙන් කටයුතු කරන කපු මහත
බවත්, ඔහුගේ නම සමන් ප්‍රියන්ත මුණසිංහ බවත්, 2019 ජූලි මාසයේ දවසක තේවාව භා
කපු මහතුන් සිටින නිළ කාමරයේ සවස පූජාවෙන් පස්සේ ප්‍රධාන කපු මහත්තයා නි
කාමරයේ ඉස්සරහා පුටුවේ වාඩි වී ප්‍රධාන කපු මහත්තයාගේ කකුල් මිරික මිරික සි
අවස්ථාවේ චූටි කපු මහත්තයා දේවාල ඇඳුමින් රතුපාට රෙදි කැල්ලකින් ඔතපු තැටියක්
අරගෙන පැමිණි බවත්, ප්‍රධාන කපු මහත්තයාගෙන් කොහේද ඒක තියන්නේ කියා ඇසූ
බවත්, ඇතුලින් තියන්න කියලා කිව් පසු චූටි කපු මහත්තයා ඒක ඇතුලේ මේසේ උඩින්
තැබූ බවත්, ඊට පස්සේ චූටි කපු මහත්තයා ප්‍රධාන කපු මහත්තයාගේ කකුල්
අල්ලලා වැඳලා දේවාලයට ගිය බවත්, චූටි කපු මහත්තයා ඒ වේලාවේ ගෙනා
මොනවද කියලා ඒ වෙලාවේ හෝ ඊට පස්සේ බැළුවේ නැති බවත්, දැනට සති දෙ
තුනකට ඉහතදී දේවාලයේ තිබෙන රත්‍රං තැටියක් දේවාලයෙන් අරගෙන ගොස් ඇ
බවට දැන ගත් බවත්, මේ කතා බහ ඇතිවෙනකොට ඉහතින් කිව්ව චූටි කපු මහත්තය
රතු රෙදි කැල්ලක ඔතලා ගෙනත් දුන්නේ ඒ රත්‍රං තැටිය බවට තේරුම් ගිය බවත්, චූ
කපු මහත්තයත් එදා ගෙනත් දුන්න රත්‍රං තැටිය ගැන තමයි මේ කතා වෙන්නේ කියල නි
බවත්, ඒකට නරක නාමය ආවේ චූටි කපු මහත්තයාට බවත්, මේ කතා බහ ඇවිස්සෙ
වෙලාවේ රත්‍රං තැටිය පූජා කලේ කව්ද කියලා චූටි කපු මහත්තයාගෙන් ඇසූ බවත්, චූ
කපු මහත්තයා ඒ ගැන මොකුත් කිව්වේ නැති බවත්, දේවාල මාලිගාවේ තිබෙන කිසිවක්
දේවාල මාලිගාව ඇතුලට යන කපු මහතුන්ට හැර වෙනත් කිසිවකුට ගැනීමට හැකියාවක්
නොමැති බවත් සඳහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

xiii. <u>අබේසිංහගේ නිසංසලා 192 B, ගොඩවෙල , ඔමල්පේ</u>

2012.06.30 වෙනිදා ඇඹිලිපිටියේදී මද්දුමාගේ ලසන්ත චන්දන පෙරේරා සමග විවාහ වූ
බවත්, අංගොඩ ලොක්කා යනුවෙන් කියන්නේ ඔහුට බවත්, ඔහුට දාව 2013.06.29 දින
පුතෙකු ලැබුණ බවත්, පුතාගේ නම මද්දුමාගේ නිවේන් සෙසත් අබේසිංහ බවත්, පුරුෂයා
2017 වසරේ දී පමණ ඉන්දියාවට පැන ගිය බවත්, එහි සිට කථා කල බවත්, වියදමට මුදල්
04. මේ දක්වා විමර්ශනයේ දී පුද්ගලයින් 38 දෙනෙකුගේ ප්‍රකාශ වාර්ථා කර ඇති අතර වැඩිදුර විමර්ශන කටයුතු සදහා පහත සදහන් අයවළුන්ගේ ප්‍රකාශයන් වාර්ථා කරන ලදි. එකී ප්‍රකාශන් වල සම්පිණ්ඩන මෙසේය.

i. <u>ආරච්චිලාගේ ඉන්දික සරත් බංඩාර,</u>

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ කොළඹ ප්‍රධාන කාර්යාලයේ වටිනා ලෝහ විශ්ලේෂණය කිරිමේ කාර්යාංශයේ සහකාර අධ්‍යක්‍ෂ වශයෙන් කටයුතු කරන බවත්, කතරගම දේවාලයේ බස්නායක තුමාගේ නිල නිවසේදි 2021.11.23 තමන් වෙත රත්‍රං තැටියක් ඉදිරිපත් කල බවත්, එම රන් පැහැති තැටියේ පිටුපස 2019 ක් වූ ඇසළ මස 03 වන දින පූජා කරන ලදි සහ මද්දුමාගේ නිවේන් සේසත් වශයෙන් තුඩකින් ලියා තිබෙන බවත්, එහි බර ප්‍රමාණය ග්‍රෑම් 292.95 වන බවත්, ඒම තැටිය වටේට ලියවැලක්ද මැද මලක්ද ඒම්බෝස් කර ඇති බවත්, තමාගේ පරීක්ෂාව අනුව මෙම රන් පැහැති තැටියේ කැරට් ප්‍රමාණය ආසන්න වශයෙන් කැරට් 21 ට ආසන්න තැටියේ වටේට ඇති ලිය වැලෙහි කොටසක පැස්සුම් දාරයක් දක්නට ඇති බවත්, රන් පැහැති තැටිය අධිකරණ නියෝගයක් සමග තමන්ගේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කල හොත් සම්පූර්ණ රසායනික පරීක්ෂනයක් කර ජාතික මැණික් හා ස්වර්ණාභරන අධිකාරියේ මුද්‍රාව තබා නැවත අධිකරණයට වාර්ථාව සමග ලබා දිමට කටයුතු කල හැකි බවත්, රත්‍රන් තැටිය රුහුනු මහා කතරගම දේවාලයේ පරිපාලන ලේකම් ලියනආරච්චිගේ විජලරත්න මහතාද, බෞද්ධ කටයුතු දෙපාර්ථමේන්තුවේ රත්නපුර දිස්ත්‍රික් ලේඛම් කාර්යාල සංකීර්ණයේ පිහිටි බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලයේ කළමණාකාර නිළධාරිණි වත්‍යාය ගැඇතිරාලලාගේ මනුජා නිදූකානි පියසිංහ මහත්මිය සහ ප්‍රධාන කළමණාකාරණ සහකාර නිළධාරි පාලියන් ගොඩගේ චමිල නිලන්ත කුමාරසිංහ මහතාද, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ගාල්ල ප්‍රාදේශිය රසායානාගාරයේ අංශ ප්‍රධානී මුහන්දිරම්ලාගේ උපුල් සම්පත් වික්‍රමසූරිය මහතාද විමර්ශනය සදහා පැමිණ සිටින කොළඹ අපරාධ කොට්ඨාශයේ නිළධාරීන්ද . ප්‍රධාන

ආරක්ෂක නිළධාරී රණසිංහ වෙලිගන් කුමාර යන අයවලුන් ඉදිරියේ පරීක්ෂා කල බවත් සදහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

ii. <u>පාලියන් ගොඩගේ චමිල නිලන්ත කුමාරසිංහ</u>

තමා දැනට රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණයේ පිහිටි බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලයේ ප්‍රධාන කළමණාකාරණ සේවා නිළධාරී වශයෙන් කටයුතු කරන බවත්, තමන් සමග රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණයේ පිහිටි බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලයේ කළමණාකාර නිළධාරිණී චතුයාය ගමඇතිරාලලාගේ මනුජා නිදූකානි පියසිංහ මහත්මිය ද පැමිණි බවත්, 2021.11.02 දිනද තමා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණයේ පිහිටි බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලයේ සහකාර කොමසාරිස් මුණවීර තන්තිරිගේ අසංඛ උචිත මුණවීර මහතා සමග පැමිණ රන් තැටිය පරීක්ෂා කල බවත්, ඒදිනද රන් පැහැති තැටිය පරීක්ෂා කිරීමෙන් පසු නැවත ඒම තැටිය මෙහි සේප්පුවේ තැන්පත් කල බවත්, ඒම සේප්පුවේ යතුර තමා භාරයට ගෙන රත්නපුර කාර්යාලයේ තැබූ බවත්, තමා ඒම යතුර රැගෙන පැමිණි බවත්, ඒම යතුරෙන් පරිපාලන ලේකම් තුමා, ප්‍රධාන ආරක්ෂක නිළධාරී වෙනිසත් කුමාර සමග සේප්පුව විවෘත කල බවත්, 2021.11.02 දින සේප්පුවේ තැබූ ආකාරයෙන්ම රන් තැටිය තිබූ බවත්, රන් පැහැති තැටියේ පිටුපස 2019 ක් වූ ඇසළ මස 03 වන දින පූජා කරන ලදි සහ මද්ධුමාගේ නිවේන් සේසත් වශයෙන් තුඩකින් ලියා තිබෙන අතර පරීක්ෂා කිරීමේදි ඒම රන් පැහැති තැටියේ කැරට් ප්‍රමාණය කැරට් 21 ට ආසන්න වන බව අනාවරණය වූ බවත්, ඒහි බර ප්‍රමාණය ග්‍රෑම් 292.95 ක් බවට දැනගත් බවත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ කොළඹ කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ ආරච්චිල්ලාගේ ඉන්දික සරත් බන්ඩාර මහතා සහ ගාල්ල ප්‍රාදේශිය කාර්යාලයේ රසායනාගාරයේ අංශ ප්‍රධානී මුහන්දිරමලාගේ උපුල් සම්පත් වික්‍රමසූරිය යන අයද තමා සමග පැමිණි නිළධාරිනියද, කොළඹ අපරාධ කොට්ඨාශයේ නිළධාරීන්ද මෙහි පරිපාලන ලේකම් තුමාද ප්‍රධාන ආරක්ෂක නිළධාරීද සහභාගී වූ බවත් සදහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

iii. <u>ලියන ආරච්චිගේ විමලරත්න</u>

තමා රුහුණු මහා කතරගම දේවාලයේ පරිපාලන ලේකම් වශයෙන් කටයුතු කරන බවත්, 2021.10.26 දින කුට්තාන්සි අංක 5296 යටතේ ඒන්.ඒම්.අජිත් පුෂ්පකුමාර යන අයගෙන් තමා භාරගත් රන් පැහැති තැටිය සේප්පුවේ තැබූ බවත්, ඒය 2021.11.02 දින කොළඹ අපරාධ කොට්ඨාශයේ නිළධාරීන් විසින් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණයේ පිහිටි බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලයේ ප්‍රධාන කළමණාකාරණ සේවා නිළධාරී පාලියන්ගොඩගේ චමිල නිලන්ත කුමාරසිංහ මහතාද, රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණයේ පිහිටි බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලයේ සහකාර කොමසාරිස් මුණවීර තන්තිරිගේ අසංඛ උචිත මුණවීර මහතාද, ප්‍රධාන ආරක්ෂක නිළධාරී වෙනිසත් කුමාර ඉදිරියේදි පරීක්ෂා කිරීමෙන් පසු නැවත ඒම රන් පැහැති තැටිය ලිපිකවරයක බහා මුද්‍රා තබා සේප්පුවේ තබා ඒම යතුර පාලියන්ගොඩගේ චමිල නිලන්ත කුමාරසිංහ මහතා වෙත භාර දුන් බවත්, මෙම පරීක්ෂණය සදහා එම යතුර රැගෙනවිත් ඇති බවත්, තමාද ආරක්ෂක නිළධාරීද සමග සේප්පුව විවෘත කර රන් පැහැති තැටිය අරගෙන පරීක්ෂා කිරීමට ඉදිරිපත් කල බවත්, ඒම පරීක්ෂා කිරීමේ කටයුතු සදහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ කොළඹ කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ ආරච්චිල්ලාගේ ඉන්දික සරත් බන්ඩාර මහතා සහ ගාල්ල ප්‍රාදේශිය කාර්යාලයේ රසායනාගාරයේ අංශ ප්‍රධානී මුහන්දිරමලාගේ උපුල් සම්පත් වික්‍රමසූරිය මහත්වරුන් විසින් සිදු කල බවත් එහිදි රන් පැහැති තැටියේ බර ප්‍රමාණය ග්‍රෑම් 292.95 ක් බවද, කැරට් ප්‍රමාණය කැරට් 21 ට ආසන්න වන බවට අනාවරණය වුන බවත්, රත්‍රන් තැටියේ පිටුපස 2019 ක් වූ ඇසළ මස 03 වන දින පූජා කරන ලදි සහ මද්ධුමාගේ නිවේන් සේසත් වශයෙන් තුඩකින් ලියා තිබෙන බවත්, මෙම පරීක්ෂාවෙන් පසු ඒම රත්‍රන් තැටිය සහ ඒය ඔතා තිබූ ලිපි කවරද, ඉටි කවරයද කුට්තාන්සි අංක 5296 ලෙස සටහන් කර තිබූ කාඩ්බෝඩ් කැබැල්ලද පොලිසිය වෙත භාර දුන් බවත් සදහන් කරමින් ප්‍රකාශ ලබා දී ඇත.

iv. <u>දේවසුරේන්ද්‍ර රතුගේ සුරංජිත් මාලින් නොහොත් මාලන්,</u>

තමන් රැකියාව වශයෙන් රත්‍රන් බඩු සාදා විකිනීම සිදු කරන බවත්, සුජිත් කියන දේවාලයේ සමහර මාස වල වැඩ කරන තමන් හඳුනන අය විසින් තමාට දේවාලයේ තැටියක් තියෙන බවත්, එවැනි තැටියක් රත්‍රන් වලින් සාදවා ගැනීමට අවශ්‍ය බවට පැවසීමෙන් පසු තමා විසින් හදලා දෙන්නම් කියා පැවසීමෙන් පසු සුජිත් විසින් දේවාලයට ගිහිං චූටි කපු මහතා හමු වීමට පැවසූ බවත්, තමා දේවාලයට ගොස් චූටි කපු මහතා වන සමන් ප්‍රියන්ත මුණසිංහ හමු වී සුජිත් අයියා කිව්ව රත්‍රං තැටිය සෑදීම සදහා දේවාලයේ ඇතුලේ තිබී චූටි කපු මහතා විසින් ගෙනවිත් දුන් සිල්වර් තැටියේ දිග පළල උස මැනගත් බවත්, තමා විසින් දේවාලයේ තිබූ තැටියේ මිනුම් අරගෙන ගිය දිනට පසු දිනයේ සුජිත් ඒ 11.00 ට 12.00 ට විතර වගේ තමාගේ ගෙදරට ඇවිත් රත්‍රන් බිස්කට් 03 ක් සහ තවත් පොඩි රත්‍රන් කෑලි කිහිපයක් දුන් බවත්, රත්‍රන් බිස්කට් 03 ඔරිජිනල් ඒවා බවත්, තමා රත්‍රං ටික කිරලා බැලීමේදි ඒතන රත්‍රන් ග්‍රෑම් 280 ට ටිකක් වැඩි ගණනක් තිබුන බවට මතක බවත්, තමා සුජිත් දීපු රත්‍රන් වලින් රත්‍රන් තැටිය හැදූ බවත්, එහි කැටයම් වශයෙන් වටේට ලියවැලකුත් මැද මලකුත් දාලා රත්‍රං තැටිය හදලා ඉවර උනාට පස්සේ සුජිත් දීපු කොලේක ලියලා තිබුනු විදියට තැටියේ පිටිපස්සේ පෙන්ඩන් මෝටරෙන් නිරෝෂන් කියන ආශාදි ගොල්ඩ් හවුස් රත්‍රන් වැඩ කරන මගේ කඩුවෙල ඉන්න යාළුවෙකුට කියලා මද්දුගේ හරි මද්දුමගේ නිවේන් සේසත් සහ 2019 ඇසල මස 03 වන දින පූජා කරන ලදි යනුවෙන් සදහන් කර 2019.07.03 වන දින පත්තිනි දේවාලය අසලට ගොස් සුජිත්ට භාර දුන්

බවත්, එතන අමිල යන අය සිටි බවත්, සුජිත් තමාට රුපියල් 40000/= ක් කුලිය වශයෙන් දුන් බවත්, රත්‍රන් හා කුලිය සුජිත් විසින් දුන් නිසා රිසිට් එකක් ලබා නොදුන් බවත්, රත්‍රන් තැටිය පූජා කරන අවස්ථාවට තමා සම්බන්ධ නොවූ බවත්, ඉන් පසු මෙම අවුරුද්දේ ඔක්තෝම්බර් මාසේ 18 හෝ ආසන්න දිනයක චූටි කපු මහතා තමාගේ නෝනගේ ෆොන් එකට කොල් කරල සුජිත්ට හදල දුන්න රත්‍රන් තැටිය වගේම රත්‍රන් තැටියක් හදලා දෙන ලෙසට පවසා ඇති බවත්, තමා එය හදලා දෙන්න සල්ලි හරි රත්‍රන් හරි ගෙනල්ලා දෙන ලෙසට පැවසූ බවත්, කොල් කල දාට පහුවෙනිදා වගේ චූටි කපු මහතා ගේ ළඟට ඇවිත් රුපියල් ලක්ෂ 25 ක් සහ පවුම් 10 ක රත්‍රන් වෙන් එකක් දුන් බවත්, සුජිත්ට හදපු රත්‍රන් තැටිය විදියටම හදන්න කියලා සුජිත්ට හදල දීපු රත්‍රන් තැටියේ ෆොටෝ එකක් වට්ස් ඇප් වලින් ඔහුගේ ෆොන් එකට එවූ බවත්, කලින් රත්‍රන් තැටියේ බරටම ග්‍රෑම් 293 යි මිලිග්‍රෑම් ගානකට හදන්න කියූ බවත්, කලින් සුජිත්ට රත්‍රන් තැටිය හදල දුන්න විදියටම ඒ ෆොටෝ එක බලාගෙන ආයිත් රත්‍රන් තැටියක් හැද බවත්.. ඊට පස්සේ ඒ රත්‍රන් තැටියෙත් කලින් හදපු රත්‍රන් තැටියේ පිටිපස්සේ කොටා තිබුණු දිනෙයි නමයි ෆොටෝ එකෙන් බලාගෙන ඒ වගේම කෙටූ බවත්, ඒ විදියට රත්‍රන් තැටිය හැදුවට පස්සේ ආපසු එක චූටි අයියට මේ අවුරුද්දේ ඔක්තෝම්බර් මාසේ 25 හෝ 26 දින හවස 02.00 ට විතර හෝ 03.00 ට විතර භාර දුන්න බවත්, රත්‍රන් තැටියේ වටිනාකම රුපියල් ලක්ෂ 41 යි වූ බවත්, රත්‍රන් තැටියේ බර ග්‍රෑම් 293 ක් බවත්, කැරට් 20 ත් 21 ත් අතර ප්‍රමාණයෙන් සැද බවත්, ඔහු සාදා දුන් මෙම රත්‍රන් තැටි දෙකම හඳුනා ගත හැකි බවත්, පසුව හැද රත්‍රන් තැටියේ පැස්සුමක් තිබෙන බවත්, සුජිත්ට හදලා දුන් රත්‍රන් තැටියත් මේ ආකාරයටම සැද බවත්, ඒහි මෙම රත්‍රන් තැටියේ ඇති ආකාරයට පැස්සුමක් නොතිබුනු බවත්, ප්‍රකාශ කර සිටී.

v. <u>ගුණසිංහ මාන්නප්පෙරුමගේ සමන් ප්‍රියන්ත හොහොත් චූටි කපු මහතාගේ නැවත ප්‍රකාශය</u>

මේ සම්බන්ධයෙන් මම 2021.11.02 දින ප්‍රකාශයක් ලබා දුන් බවත්, සුජිත් , මාලන් හා අමිල යන තුන් දෙනා 2019 ජුනි මාසේ දවසක දේවාලයට ආ බවත්, ඒ තුන් දෙනා ආවාට පස්සේ අමිල විසින් දේවාලයට අඩු පාඩු දෙයක් කියන්න එක රත්‍රන් වලින් හදල දෙන්නම් කියලා කියූ බවත් ඊට පස්සේ දේවාලේ ඇතුල තිබුණ රිදී තැටිය ගෙනල්ලා පෙන්නලා ඒ විදියේ රත්‍රන් තැටියක් හදලා දෙන්න කියලාඑ කියූ බවත්, ඒ වෙලාවේ ඒ තැටියේ ප්‍රමාණය මැනගත් බවත්, ඊටපස්සේ 2019.07.03 දින ඒ ප්‍රමාණයට හදපු රත්‍රන් තැටිය රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන්න දවල් 01.00 ට විතර අමිල හා සුජිත් ආ බවත්.ඊට පස්සේ සෝමිපාල කපු මහත්තයට කියලා ඒ රත්‍රන් තැටිය දේවලයට පූජා කලඑ බවත්, .දේවාලය ඇතුලේ ඒ රත්‍රන් තැටිය තැබුවේ උපුල් කපු මහත්තයා බවත්, ඒ රත්‍රන් තැටිය පූජා කරන වෙලාවේ අමිල හා සුජිත් එක්ක රත්‍රන් තැටිය පූජා කරන තැන තවත් පිරිමි දෙන්නෙක් සිටිය බවත්, ඒ මාසය භාරව සිටියේ සෝමිපාල ප්‍රධාන කපු මහත්තයා බවත්, ඒයාට මම කියන්නේ මුත්තා කියලා බවත්, රත්‍රන් තැටිය පූජා කරල සති දෙකක් විතර දේවාලයේ තිබුනාට පස්සේ තමයි මුත්තා රත්‍රන් තැටිය ගෙනත් දෙන්න කියූ බවත්, රත්‍රන් තැටිය දේවාලයෙන් අරගෙන ගිහිල්ලා මාසය භාර කපු මහත්තය ඉන්න කාමරයත් තිබු බවත්, රත්‍රන් තැටිය ගිහින් දෙන වෙලාවේ කන්දා මුත්තගේ කකුල් පිරිකා පිරිකා හිටිය බවත්, රත්‍රන් තැටිය රතු පාට රෙදි කැල්ලක ඔතාගෙන තමයි ගිහින් තැබූ බවත්, සම්ප්‍රධානුකූලව දේවාලයට පූජා කරන බඩු සම්බන්ධයෙන් ඒ මාසයේ භාරව සිටින කපු මහත්තය තමයි වග කියන්න ඕනි බවත්, 2021 අවුරුද්දේ ඔක්තෝම්බර් මාසයේදී තමයි දේවාලයට පූජා කරපු රත්‍රන් තැටියක් දේවාලයේ නෑ කියලා ප්‍රසිද්ධ වූ බවත්, ඒකට එහුගේ නමත් මුත්තගේ නමත් සම්බන්ධ වෙලා තිබුණ බවත්, මේ සිද්ධිය ප්‍රචාරය වුනාට පස්සේ ඔහුටයි අමිලටයි බස්නායක නිලමේ තුමා එන්න කියලා කොල් කරල කියූ බවත්ඔවුන් දෙන්න බස්නායක නිලමේ තුමාගේ වලව්වේදී බස්නායක නිලමේ තුමාව හමුවූ බවත්, නිලමේ තුමා ඔහුගෙන් දේවාලයට රත්‍රන් තැටියක් පූජා කරල තියෙනවද කියා ඇසූ බවත්.. මුත්තගේ මාසයේදී රත්‍රන් තැටියක් ලැබුණා ඒ " රත්‍රන් තැටිය ඔහු විසින් මුත්තගේ කාමරෙන් තියලා මුත්තට භාර දුන්නා කියලා කියූ බවත්, දේවාලයටත් අගෞරවයක් වෙනවා ඒ නිසා කපු මහත්තුරු එක්ක සාකච්ඡා කරලා මේ ගැන හොයලා පියවරක් ගන්න කියලා නිලමේ තුමා කියූ බවත්.ඒ වෙලාවේ රාලහාමි කපු මහත්තයත් උපුල් කපු මහත්තයත් සිටිය බවත්, ඊට පසු ඔහු මුත්තා හමුවෙන්න අමිල එක්ක මුත්තගේ ගෙදරට ගිය බවත්, ඊට පස්සේ ඔහු මුත්තට කිව්වා මුත්තගේ මාසේ පූජා කරපු රත්‍රන් තැටිය මාලිගාවේ නෑ කියලා තමයි ප්‍රශ්නෙ වෙලා තියෙන්නෙ කියලා කියූ බවත්, ඊට පස්සේ මුත්තා ඔක හදවපු තැනින් අලුතින් හදවලා මාලිගාවට දෙන්න මගේ මාසේදී මම සල්ලි දෙන්නම් කියූ බවත්, මුත්තට තියෙන ගෞරවය නිසා මම මුත්තව බේරගන්න ඕනි නිසා අමිලත් එක්ක කලින් රත්‍රන් තැටිය හදපු මාලන්ව හමුවෙන්න ගිය බවත්, කලින් හැදූ රත්‍රන් තැටිය වගේම රත්‍රන් තැටියක් දවස් 05 කින් විතර හදලා දෙන්න කියූ බවත්, ඒක හදන්න රුපියල් ලක්ෂ 25 ක මුදලකුත් පවුම් 10ක රත්‍රන් වෙන් එකකුත් දුන් බවත්, රන් තැටිය සෑදීමට ලක්ෂ 41 මුදලක් වියදම් වූ බවත්, රත්‍රන් තැටිය හදලා මට දුන් දවසෙම ඒම රත්‍රන් තැටිය මුත්තගේ ගෙදරට අමිලයි ,පසිදුයි, අපිතුයි අරගෙන ගිය බවත්, ඊට පස්සේ ලේකම් මහත්තයට ඒ තැටිය භාර ඇති බවත්, මේ විදියට අලුතින් රත්‍රන් තැටිය හදලා භාර දෙන්න කටයුතු කලේ මුත්තට තියන ගෞරවයටයි දේවාලයට තියෙන ගෞරවයටයි මුත්තව බේරගන්න ඕනි නිසා බවත්,මේ සම්බන්ධයෙන් ඔහු උසාවියට ප්‍රකාශයක් දෙන්නත් සූදානම් බවත් ප්‍රකාශ කර සිටී.

vi. <u>රණවීර ආරච්චිගේ වෙනිෂුන් කුමාර යන අයගේ ප්‍රකාශය</u>

ඔහු වසර 25 ක පමණ කාලයක සිට රුහුනු මහා කතරගම දේවාලයේ ප්‍රධාන ආරක්ෂක නිළධාරි ලෙස කටයුතු කරන බවත්, 2021.10.26 දින දේවාලයේ පරිපාලන ලේකම් කාර්යාලයට රත්‍රන් පැහැති තැටියක් භාර දීමේ කටයුත්තට සම්බන්ධ වූ බවත්, ඒ රත්‍රන් තැටිය ඉටි කොලේක දාලා

ලියුම් කවරයක් ඇතුලේ දාලා මුද්‍රා තබලා ඒ ලියුම් කවරය උඩ ඔහුයි ගණකාධිකාරි තුමයි , පරිපාලන ලේකම් තුමයි අත්සන් කරල වලව්වේ ඇතුලේ තිබෙන සේප්පුවේ තැම්පත් කල බවත්. ඊට පස්සේ 2021.11.02 දින මෙම ස්ථානයට රත්නපුර දිස්ත්‍රික් ලේඛම් කාර්යාල සංකිර්ණයේ පිහිටි බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලයේ සහකාර කොමසාරිස් මුණවීර තන්තිරිගේ අසංඛ උවින් පුණවීර මහතාද . පාලියන් ගොඩගේ චමිල නිලන්ත කුමාරසිංහ මහතාද පරිපාලන ලේකම්තුමාද . ගණකාධිකාරිතුමාද . අමිල සහ අජිත්ද මාද ඉදිරියේ කොළඹ අපරාධ කොට්ඨාශයේ නිළධාරීන් විසින් පරීක්ෂා කල බවත්. ඊට පසු නැවතත් එම රත්‍රන් තැටිය කලින් ඔතා තිබූ ඉටි කවරයද . ලියුම් කවරයද ඇතුලත් කර නවත් අලුත් ලියුම් කවරයක දමා සේප්පුවේ දමා සේප්පුවේ යතුර පාලියන් ගොඩගේ චමිල නිලන්ත කුමාරසිංහ මහතා රැගෙන ගිය බවත්. නැවතත් 2021.11.24 දින සේප්පුවේ තිබූ රත්‍රන් තැටිය මාද පරිපාලන ලේකම් තුමාද .අසංක මහතාද සමග අසංක මහතා රැගෙන ආ සේප්පුවේ යතුරින් සේප්පුව විවෘත කර එළියට ගත් බවත්. ඊටපසු ඒම රත්‍රන් තැටිය ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ කොළඹ කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ ආරච්චිල්ලාගේ ඉන්දික සරත් බන්ඩාර මහතා සහ ගාල්ල ප්‍රාදේශිය කාර්යාල්යේ රසායනාගාරයේ අංශ ප්‍රධානී මුහන්දිරම්ලාගේ උපුල් සම්පත් වික්‍රමසූරිය මහතා විසින් පරීක්ෂා කල බවත්. පරීක්ෂා කිරීමේදි රන් පැහැති තැටියේ කැරට් ප්‍රමාණය කැරට් 21 ට ආසන්න වන බවද . බර ප්‍රමාණය ග්‍රෑම් 292.95 ක් බවද දැනගත් බවත්. ඒම රත්‍රන් තැටියේ පිටුපස වර්ශ 2019 ක් වූ ඇසළ මස 03 වන දින පූජා කරන ලදි සහ මද්දුමාගේ නිරෝෂන් රොෂාන් වශයෙන් තුඩකින් ලියා තිබෙන බවත්. පරීක්ෂා කිරීමේ අවස්ථාවට මාද රත්නපුර දිස්ත්‍රික් ලේඛම් කාර්යාල සංකිර්ණයේ පිහිටි බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලයේ කළමණාකාර නිළධාරිණී වතුයාය ගම්ඇතිරාලලාගේ අනුජා නිදූකානි පියසිංහ මහත්මිය සහ සහකාර කොමසාරිස් මුණවීර තන්තිරිගේ අසංඛ උවින් පුණවීර මහතාද කොළඹ අපරාධ කොට්ඨාශයේ නිළදාරින්ද සහභාගී වූණ බවත්. පරීක්ෂා කිරීමෙන් පසු රත්‍රන් තැටිය කොළඹ අපරාධ කොට්ඨාශයේ නිළධාරීන් විසින් භාර ගනු ලැබූ බවත් ප්‍රකාශ කර සිටී.

vii. <u>දිය කපන කපු දුරන්දර කෝනාර මුදියංසේලාගේ උපුල් නිලන්ත සමරකෝන් යන අයගේ නැවත ප්‍රකාශය</u>

ඔහු දේවාලයේ සිටින වේලාවක මා හට දේවාලයට පූජා කල රත්‍රං තැටියක් මාළිගාවේ තැබීමට මා විසින් භාර ගෙන නොමැති බවත්. රත්‍රං තැටිය පූජා කිරීමට කවුරුන් පැමිණියා කියන්නත් කියා දන්නේ නැති බවත්..රත්‍රං තැටිය දේවාල මාළිගාවේ තිබෙන බවට දැන නොමැති බවත්. ප්‍රකාශ කර සිටී.

viii. <u>මුණසිංහ මාන්නප්පෙරුමගේ අජිත් පුෂ්පකුමාර යන අයගේ ප්‍රකාශය</u>

2021.11.02 දින ප්‍රකාශයක් ලබා දුන් බවත්. ඔහු එදා ලබාදුන් ප්‍රකාශයේ දී පසිදු සමග මොටර් සයිකලෙන් මුත්තාගේ ගෙදරට ගොස් මුත්තා විසින් රතු පාට රෙදි කැල්ලක ඔතපු රත්‍රං මල්වට්ටිය සුදුපාට ටියුලිප් බෑග් එකක දාලා තිබුන බවත්. මුත්තාගෙන් ඒක රැගෙන පැමිණ පසිදු ගේ ලග බසසවා අමිල සමග ගොස් රත්‍රං තැටිය දේවාලයේ පරිපාලන ලේඛම් වෙත භාර දුන් බව ප්‍රකාශ කලද ඇත්ත වශයෙන්ම සිදු වූයේ මුත්තා ඔහු හට 2021.10.26 දින කෝල් 04 ක් අරගෙන කියා සිටියා අයියා රත්‍රං තැටියක් ගෙනල්ලා දෙයි ඒක අරගෙන මුත්තාගේ ගෙදරට එන්න කියූ බවත්. අයියා එන්න පරක්කු නිසා ඔහු කුඹුරට ගිය බවත්. කුඹුරේ ඉදලා හවස දෙකට විතර පුව එම ගෙදර එනකොට ෆෝන් එකේ මුත්තාගේ මිස් කෝල් 02 ක් තිබුණ බවත්. ඔහු බත් කමින් ඉන්නකොට මුත්තා නැවත කෝල් කරලා තාම අයියා ආවේ නැද්ද වික් ගාලා අරගෙන එන්න කියලා කියූ බවත්. අයියා ගෙනල්ලා දුන්න ගමන් අරගෙන එන්නම් කියලා කියූ බවත්. එහෙම කියලා ටික වෙලාවක් ඉන්නකොට මගේ අයියා වන සමන් ප්‍රියන්ත වැන් එකෙන් පැමිණිය බවත්. අයියා ඔහුට බෑග් එකක් දීලා මුත්තට ගිහින් දෙන්න කියලා කියූ බවත්. ඔහු බයිසිකලේ අයියා දුන්න රත්‍රං පාට තැටිය අඩංගු බෑග් එක අරගෙන පසිදුත් එක්ක මුත්තාගේ ගෙදරට ගිය බවත්.. මුත්තනා විසින් ලේඛම් මහත්තයාට කෝල් කරලා කිව්වා චූටි කපු මහත්තයාගේ මල්ලි රත්‍රංතැටිය ගේනවා ඒක භාර ගන්න කියලා කියූ බවත්. ඊට පස්සේ ඔහු ඒ රත්‍රංතැටියත් අරගෙන දේවාලයට යන්න පිටත් වූ බවත්. පසිදු ගෙවල් ගාව හන්දියේ බැස්සා. අමිලලගේ ගේ ගාවට ගිහින් අමිල එක්ක දේවාලෙට ගිහින් කලින් ප්‍රකාශයේ දි සදහන් කල ආකාරයට රත්‍රංතැටිය ලේඛම් තුමාට භාර දුන් බවත්. ප්‍රකාශ කර සිටී.

ix. <u>මුණසිංහ මාන්නප්පෙරුමගේ අමිල නුවන් මුණසිංහ යන අයගේ නැවත ප්‍රකාශය</u>

2021.11.02 දින මා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා දුන් බවත්. ඔහු කලින් කල ප්‍රකාශයේ දි 2021.10.26 දින පූජා කරන ලද රත්‍රංතැටිය සැදවීම පිළිබදව කියා සිටියේ නැති බවත්. මුත්තා විසින් සුජිත්ට එන්න කියලා කියා තිබූ නිසා 2021 දහවෙනි මාසයේ 15 වෙනිදගෙන් පස්සේ දවසක සුජිත් සමග සොම්පාල කපු මහත්තයා හම්බවෙන්න ගිය බවත්. සොම්පාල කපු මහත්තයාට අත්තා කියලා අඩගහන බවත්.සුජිත් ඔහුව එක්කගෙන ගියේ සුජිත්ට මුත්තා ගහනවා කියලා කියපු නිසා බවත්. අත්තාගේ ගෙදරට ඔහු සුජිත් එක්ක ගිය වෙලාවේ මුත්තා, සුජිත්ගෙන් ඇහුවා කොහෙද උඹ ගියේ කියලා ඇසූ බවත්. රාළහාමි කපු මහත්තයයි උපුල් කපු මහත්තයයි තමයි රත්‍රං තැටියේ ප්‍රශ්ණය ගැන අදින්නේ කියලා සුජිත් කියූ බවත්. කවුරු ඇහුවත් කියන්න ඒ රත්‍රං තැටිය මේ කරලා දවස් 03 කට පස්සේ පූජා කරපු කට්ටියම ආපසු අරන් ගියා කියන්න කියලා මුත්තා සුජිත්ට කියූ බවත්. ඊට පස්සේ දවසේ සමන් ප්‍රියන්ත කපු මහතා සමග නිළමේ තුමාගේ දැනුම් දීම අනුව වලව්වට ගිය බවත්. එසේ ගියේ දේවාලයට පූජාකරපු රත්‍රංතැටිය දේවාලයේ නොතිබීම සම්බන්ධව කථා කරන්න බවත්. ඒ වෙලාවේ රාළහාමි කපු මහතාත් උපුල් කපු මහතාත් සිටිය බවත්. ඔහු නැතුව ඔවුන් භනරදෙනා කථාබහ කල බවත්. ඔවුන් එක්ක කථා

කලාට පස්සේ නිළමේ තුමා මටත් කථා කරලා මොනවද වෙලා තියෙන්නේ කියලා ඇසූ බවත්, ඒ වෙලාවේ ඔහු මුත්තා කියපු විදිහට රත්‍රං නැටිය පූජා කරපු අය පේ කරලා ඊට පස්සේ අරගෙන ගියා කියලා නිළමේතුමාට කියූ බවත්, ඊට පස්සේ දවසක ඉන් පස්සේ චූටි අයියා සමග ගොස් මාලන්ව හමු වී මාලන්ට සල්ලි වගයකුයි රත්‍රං මාලයකුයි දී නැතිවෙච්ච නැටිය වගේ රත්‍රංනැටියක් හදලා දෙන්න කියලා කියූ බවත්, 2021.10.26 දින චූටි අයියයි, පසිදුයි එක්ක ගිහින් රත්‍රං නැටිය මාලන්ගෙන් අරගෙන ආ බවත්, චූටි අයියා රත්‍රංනැටිය අරගෙන ගෙදර ගිය බවත්, ඊට පස්සේ ඔහු ගෙදර ඉන්කොට පැයකින් විතර පස්සේ අජිත්ගෙන් කෝල් එකක් ආ බවත්, අජිත් ඔහුගෙන් රත්‍රංනැටිය භාර දෙන්න දේවාලෙට යමුද කියලා ඇහුව බවත්, රත්‍රං නැටිය බෑග් එකේ දාගෙන අජිත් සමග දේවාලෙට ගිය බවත්, ඊට පස්සේ කලින් ප්‍රකාශයේ දී පැවසූ ආකාරයට දේවාලයේ දී රත්‍රං නැටිය භාර දුන් බවත්, රුහුණු මහා කතරගම දේවාලයේ කටයුතු කරන විදිහ අනුව මාසය තුල පූජා කරන භාන්ඩ රිසිට් පිට පූජා කරන්නේ නැත්නම් මාසය භාර කපු මහතා එයට ලබා ගත හැකි බවත්. එවැනි සම්ප්‍රදායක් තමයි රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන භාණ්ඩ සම්බන්ධයෙන් පැවත එනබවත් ප්‍රකාශ කර සිටී.

x. <u>රත්නායක විදාන පතිරණගේ පසිදු මධුශංක නොහොත් කිරි ගෙදර පසිදු යන අයගේ ප්‍රකාශය</u>

2021.11.23 දින ප්‍රකාශයක් ලබා දුන් බවත්, එම ප්‍රකාශයේ දී ඔහු 2021.10.26 දින අජිත් විසින් රුහුණු මහ කතරගම දේවාලයේ පරිපාලන ලේඛම් වෙත භාර දෙන ලද රත්‍රං නැටිය සෑදීම පිළිබදව ප්‍රකාශයේ දී ලබා දුන්නේ නොමැති බවත්. 2021.11.20 හෝ 21 දින සමන් ප්‍රියන්ත කපු මහතා හවස කෝල් කරලා ගමනක් යන්න තියෙනවා යමු ද කියලා ඇසූ බවත් ඔහු හා කිව්ව නිසා සමන් ප්‍රියන්ත කපු මහතාගේ වෑන් එකෙන් අමිලගේ ගෙදරට ගිය බවත් අමිලත් වෑන් එකට දාගෙන මාලන්ගේ ගෙදරට ගොස් සමන් ප්‍රියන්ත කපු මහතා සල්ලියි රත්‍රං වෙන් එකකුයි මාලන්ට දීලා කිව්වා කලින් හදපු විදිහටම රත්‍රං නැටිය හදන්න කියලා කියූ බවත්, නැවතත් 2021.10.26 දින සමන් ප්‍රියන්ත කපු මහතා එක්ක වෑන් එකේ මමයි අමිලයි මාලන්ගේ ගෙදරට ගොස් රත්‍රං නැටිය අරගත්ත බවත්. රත්‍රං නැටිය ගත්තට පස්සේ කතරගමට ඇවිත් ඔහුව ගේ ගාවින් බැස්සා අමිලයි සමන් ප්‍රියන්ත කපු මහතායි වෑන් එකේ ගිය බවත්, ඊට පස්සේ ටික වෙලාවකින් අජිත් ඔහුට කෝල් කරලා මුත්තලගේ ගෙදරට ගිහින් එන්න යමුද කියලා ඇසූ බවත්, මුත්තා කියන්නේ සොමපාල ටී රත්නායක කියන කපු මහත්තයාට බවත්, ඔහු හා කිව්ව නිසා, අජිත් එක්ක මුත්තලගේ ගෙදරට ගිය බවත්, අජිත් මුත්තගේ ගේ ඇතුලට යනකොට සිලිප් බෑග් එකක් වගේ එකක් අරගෙන ගිය බවත්, එනකොටත් ඒ බෑග් එකත් අරගෙන ආව බවත්, ඔහුව බැස්සුවාට පස්සේත් අජිත් ඒ බෑග් එක අරගෙන ගියා බවත්, ඉන් පසු අජිත්ට කෝල් එකක් ගත්තට පස්සේ අජිත් කතරගම දේවාලේ ඔෆිස් එක ලගට එන්න කියූ බවත්, ඒ නිසා ඔහු එතන්ට ගිය බවත්, ඔහු යනකොට අජිතුයි අමිලයි ඔෆිස් එකෙන් එළියේ හිටිය බවත්, ටික වෙලාකින් රාළහාමි කපු මහත්තයයි, පියුෂාන් ටී රත්නායක කපු මහත්තයි ආ බවත්, රාළහාමි කපු මහත්තාය කිව්වේ සරත් සේපාල ටී රත්නායක කපු මහත්තයාට බවත්, පියුෂාන් කිව්වේ රාළහාමි කපු මහත්තයාගේ පුතාට බවත්..ඊට පස්සේ ලේඛම් තුමා කට්ටිය එක්කගෙන වලව්වට ගිය බවත්, සිකුරිටි ඕ අයි සී, අජිත් හා අමිලත් ගිය බවත්, හවස 04.00 ට විතර එළියට ආ බවත්, මාලන් හදපු රත්‍රං නැටිය දේවාලයට භාර දීම තමයි ඒ අවස්ථාවේ දී සිදු වුනේ කියලා ඔහු දන්නා බවත්, ඒ වෙලාව වෙනකොට අනිත් අය කවුරුත් ඇත්ත කියපු නැති නිසා තමයි ඔහුට ප්‍රශ්ණයක් වෙයි කියලා මාත් ඇත්ත නොකිව බවත් ප්‍රකාශ කර සිටී.

xi. <u>රත්නායක විදාන පතිරණගේ ප්‍රමිත සම්පත් යන අයගේ ප්‍රකාශය</u>

ඔහු රුහුණු මහා කතරගම දේවාලයේ කපු මහතුන් යටතේ වසර 12 ක් පමණ මේ දක්වා සේවය කරන බවත්.රුහුණු මහා කතරගම දේවාලයේ තේවාව සදහා ප්‍රධාන කපු මහතුන් 15 කු සේවය කරන බවත්, ඔවුන්ගෙන් 14 දෙනෙක් රුහුණු මහා කතරගම දේවාලයේ තේවා කටයුතු කරන බවත්.දියකපන කපු මහතා තේවාවන් භාරව කටයුතු නොකරන.බවත්, මෙම කපු මහතුන් 15 දෙනාට සහ බස්නායක නිළමේ තුමාට පමණක් රුහුණු මහා කතරගම දේවාලයේ මාළිගාව ඇතුලට යා හැකි බවත්, කපු මහතුන් යටතේ සේවය කල ද ඔවුන්ට දේවාල මාළිගයට යා නොහැකි බවත්, රුහුණු මහා කතරගම දේවාලයේ තේවාව භාරව එක් මාසයකට එක් කපු මහතකු පත් කරන බවත්, බැතිමතුන් කාර්‍යාලයේ රිසිට්පත් නොමැතිව දේවාලයට පූජා කරන භාණ්ඩ මාසයේ තේවාව භාර කපු මහතාට අයිති වන බවත්, එය රුහුණු මහා කතරගම දේවාලයේ පැවත එන සම්ප්‍රදාය බවත්, වසර 12 ක කාලයක සිට ඔහු එහි සේවය කරන අතර මාසය භාර කපුමහතුන් විසින් ඔවුන්ගේ මාසයේ දි බැතිමතුන් පූජා කරන පඩුරු සහ භාණ්ඩ මාසය භාර කපු මහතා විසින් රැගෙන යන බවත්, දේවාලයේ පරිපාලන ලේඛම් කාර්‍යාලයේ රිසිට් කඩා පූජා කරන මුදල් කාර්‍යාලයට භාර ගන්නා අතර රත්‍රං භාණ්ඩ දේවාල මාළිගාවේ පිටත මණ්ඩපයේ තබා තිබෙන මුදල් ආධාර පෙට්ටියේ කොටසක ඇති සේප්පුවේ තැන්පත් කරන බවත්, ඒ කටයුතු සිදු කරන්නේ කාර්‍යාලය විසින් සිදුකරන බවත් එලෙස රිසිට් කඩා පූජා කරන භාණ්ඩ දේවාල මාළිගාව ඇතුලේ ද තැන්පත් නොකරන බවත්, ප්‍රකාශ කර සිටී.

xii. <u>මුණසිංහ ලලිත් අනුරුද්ධ මුණසිංහ යන අයගේ ප්‍රකාශය</u>

2016 වර්ෂයේ සිට මේ දක්වා රුහුණු මහා කතරගම දේවාලයේ කපු ධූරන්ධර තනතුර සිදු කරන බවත්, කපු මහතුන් 15 දෙනෙක් රුහුණු මහා කතරගම දේවාලයේ සේවය කරන බවත්, ඉන් ඔහුත්, ප්‍රධාන කපු මහතාත්, සරත් සේපාල ටී රත්නායක, කරුණාරත්න ටී රත්නායක, ලාල් අරාපක්ෂ, ආනන්ද ටී රත්නායක, එම්.එම්. සමන් ප්‍රියන්ත, ටී.ආර්. සනත් ප්‍රේමකුමාර, ටී.ආර්. අනුර, ටී.ආර්. ලලිත් රත්නායක යන කපු මහතුන් මාසික තේවාව භාරව කටයුතු කරන බවත්, දියකපන කපුරාළ වශයෙන් උපුල් නිලන්ත සමරකෝන් කටයුතු කරන බවත්, තේවාව භාරව

කටයුතු කරන කපු මහත්වරුන් හතර දෙනෙකුගේ පුතුන් හතර දෙනෙක් වන නිමිලන් රත්නායක සිනෙත් පියුෂාන්, අරාපක්ෂ මුදියන්සේලාගේ ගයාන් වමිල බණ්ඩාර, සචිත් චානක නිශිලත් රත්නායක සහ ටී.ආර්.දේවින්ද සම්පත් යන අයද කපු මහතුන් වශයෙන් ඔවුන්ගේ පියා මාසික තේවාව කරන කාලයේ දී සහයට කටයුතු කරන බවත්, ඔහු ඇතුළු කපු මහතුන් 14 දෙනාට සහ බස්නායක නිළමේ තුමාට පමනක් දේවාල මාළිගාවට ඇතුලු විය හැකි බවත්, බැතිමතුන් රුහුණු මහා කතරගම දේවාලයට පූජා වට්ටි සමග පඩුරු වශයෙන් මුදල් ද, රත්‍රං ඇතුලු භාණ්ඩ පූජා කරන බවත්, පූජා වට්ටි සමග පූජා කරන පඩුරු මුදල් අයත් වන්නේ මාසික තේවාව භාර කපු මහතා බවත්, කාර්යාලයේ රිසිට්පත් කඩා පූජා කරනු ලබන භාණ්ඩ හැර බැතිමතුන් දේවාලයට පූජා කරන රත්‍රං සහ භාණ්ඩද මාසික තේවාව භාර කපු මහතාට අයත් වෙන බවත්, එය රුහුණු මහා කතරගම දේවාලයේ පැවත එන සම්ප්‍රධාය බවත්, පූජා කරනු ලබන රත්‍රං පිළිම ඇතුලු දේව ආභාරණ පමණක් දේවල මාළිගාවේ තැන්පත් කරනු ලබන බවත්, ඒ හැර අනිකුත් භාණ්ඩ මාසික තේවාව භාර කපු මහතාට සම්ප්‍රධානුකූලව අයිති වන බවත්, ප්‍රකාශ කර සිටී.

xiii. <u>සනත් ප්‍රේමකුමාර නිමලත් රත්නායක යන අයගේ ප්‍රකාශය</u>

ඔහු වසර 34 ක පමණ කාලයක සිට රුහුණු මහා කතරගම දේවාලයේ කටයුතු කරන බවත්, කපු මහතුන් 15 දෙනෙක් රුහුණු මහා කතරගම දේවාලයේ සේවය කරන බවත්, ඉන් ඔහුත්, ප්‍රධාන කපු මහතාත්, සරත් සේපාල ටී රත්නායක, කරුණාරත්න ටී රත්නායක, ලාල් අරාපක්ෂ, ආනන්ද ටී රත්නායක, එම්.එම්. සමන් ප්‍රියන්ත, ටී.ආර්. සනත් ප්‍රේමකුමාර, ටී.ආර්. අනුර, ටී.ආර්. ලලිත් රත්නායක යන කපු මහතුන් මාසික තේවාව භාරව කටයුතු කරන බවත්, දියකපන කපුරාළ වශයෙන් උපුල් නිලන්ත සමරකෝන් කටයුතු කරන බවත්, තේවාව භාරව කටයුතු කරන කපු මහත්වරුන් හතර දෙනෙකුගේ පුතුන් හතර දෙනෙක් වන නිමිලත් රත්නායක සිනෙත් පියුෂාන්, අරාපක්ෂ මුදියන්සේලාගේ ගයාන් වමිල බණ්ඩාර, සචිත් චානක නිශිලත් රත්නායක සහ ටී.ආර්.දේවින්ද සම්පත් යන අයද කපු මහතුන් වශයෙන් ඔවුන්ගේ පියා මාසික තේවාව කරන කාලයේ දී සහයට කටයුතු කරන බවත්, ඔහු ඇතුළු කපු මහතුන් 14 දෙනාට සහ බස්නායක නිළමේ තුමාට පමනක් දේවාල මාළිගාවට ඇතුලු විය හැකි බවත්, බැතිමතුන් රුහුණු මහා කතරගම දේවාලයට පූජා වට්ටි සමග පඩුරු වශයෙන් මුදල් ද, රත්‍රං ඇතුලු භාණ්ඩ පූජා කරන බවත්, පූජා වට්ටි සමග පූජා කරන පඩුරු මුදල් අයත් වන්නේ මාසික තේවාව භාර කපු මහතා බවත්, කාර්යාලයේ රිසිට්පත් කඩා පූජා කරනු ලබන භාණ්ඩ හැර බැතිමතුන් දේවාලයට පූජා කරන රත්‍රං සහ භාණ්ඩද මාසික තේවාව භාර කපු මහතාට අයත් වෙන බවත්, එය රුහුණු මහා කතරගම දේවාලයේ පැවත එන සම්ප්‍රධාය බවත්, පූජා කරනු ලබන රත්‍රං පිළිම ඇතුලු දේව ආභාරණ පමණක් දේවල මාළිගාවේ තැන්පත් කරනු ලබන බවත්, ඒ හැර අනිකුත් භාණ්ඩ මාසික තේවාව භාර කපු මහතාට සම්ප්‍රධානුකූලව අයිති වන බවත්, බැතිමතෙකු විසින් 2019.07.03 දින රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන ලද රත්‍රං තැටියක් දේවාල මාළිගාවේ නොමැති වී පිළිබඳව මාධ්‍ය වල ප්‍රචාරය වූ පසුව දැනගත් බවත්, ජන මාධ්‍ය වලින් ප්‍රචාරය වූ රත්‍රං තැටිය 2019 වර්ෂයේ පෙරහැර මාසයේ දේවාලයට පූජා කිරීම පිළිබද මා කිසිවක් නොදන්නා බවත්, මාධ්‍ය වලින් ප්‍රචාරය වූ ආකාරයේ රත්‍රං තැටියක් දේවාල මාළිගාවේ තිබුණා ද කියා ඔහුගේ මතකයේ නොමැති බවත්, ප්‍රකාශ කර සිටී.

xiv. <u>අාරාපක්ෂ මුදියන්සේලාගේ ගයාන් වමිල බණ්ඩාර යන අයගේ ප්‍රකාශය</u>

ඔහු වසර 15 ක් පිටත කට්ටලයේ එනම් දේවාලයෙන් පිටත වැඩ කටයුතු කල අතර දැනට වසර 06 ක කාලයක සිට කපු ධරන්ධර වරයෙක් වශයෙන් ඇතුල් කට්ටලයේ රුහුණු මහා කතරගම දේවාලයේ කටයුතු කරන බවත්, ප්‍රධාන කපු මහතා වන්නේ සෝමපාල නිශිලත් රත්නායක මහතායි. කපු මහතුන් 15 දෙනෙක් රුහුණු මහා කතරගම දේවාලයේ සේවය කරනවා. ඉන් සනත් ප්‍රේමකුමාර නිශිලත් රත්නායක , ප්‍රධාන කපු මහතාත්, සරත් සේපාල ටී රත්නායක, කරුණාරත්න ටී රත්නායක, අරාපක්ෂ මුදියන්සේලාගේ මුතුබණ්ඩා, ආනන්ද ටී රත්නායක, එම්.එම්. සමන් ප්‍රියන්ත, ලලිත් මුණසිංහ, ටී.ආර්. අනුර, ටී.ආර්. ලලිත් රත්නායක යන කපු මහතුන් මාසික තේවාව භාරව කටයුතු කරන බවත්,. දියකපන කපුරාළ ලෙස උපුල් නිලන්ත සමරකෝන් කටයුතු කරන බවත්, තේවාව භාරව කටයුතු කරනු ලබන කපු මහත්වරුන් හතර දෙනෙකුගේ පුතුන් හතර දෙනෙක් වන නිශිලත් රත්නායක සිනෙත් පියුෂාන්, සචිත් චානක නිශිලත් රත්නායක සහ ටී.ආර්.දේවින්ද සම්පත් යන අය සහ ඔහු කපු මහතුන් වශයෙන් අපගේ පියා මාසික තේවාව කරන කාලයේ දී සහයට කටයුතු කරන බවත්, නමුත් ඔවුන් 04 දෙනාට සහ දිය කපන කපුරාළ වශයෙන් කටයුතු කරන උපුල් කපු මහතා මාසික තේවාව භාරව දැනට කටයුතු නොකරන බවත්, ප්‍රධාන තේවාව භාර කපු මහතුන් 15 දෙනාට සහ බස්නායක නිළමේ තුමාට පමනක් දේවාල මාළිගාවට ඇතුලු විය හැකි බවත්, බැතිමතුන් රුහුණු මහා කතරගම දේවාලයට පූජා වට්ටි සමග පඩුරු වශයෙන් මුදල් ද, රත්‍රං, පිත්තල භාණ්ඩ, රිදී භාණ්ඩ, හාල්, කපුරු, හඳුන්කූරු, රතු පැහැති රෙදි, එළවළු, සියළුම වර්ගයේ තෙල් ඇතුලු දේවාලයේ පැවැත්ම සඳහා අවශ්‍ය සියළුම භාණ්ඩ සහ හරක්, කුකුල්ලු, එළුවන් ආදි සතුන් ද, පොල් පැළ ඇතුලු සියළුම ශාක වර්ග ද පූජා කරන බවත්, බැතිමතුන් පූජා වට්ටි සමග පූජා කරන පඩුරු මුදල් අයත් වන්නේ මාසික තේවාව භාර කපු මහතාට බවත්, කාර්යාලයේ රිසිට්පත් කඩා බැතිමතුන් පූජා කරනු ලබන භාණ්ඩ සහ දේවාලයේ පඩුරු පෙට්ටි වලට පූජා කරනු ලබන මුදල් ද, රත්‍රං, පිත්තල භාණ්ඩ, රිදී භාණ්ඩ දේවාලයට අයත් වෙන අතර කපු මහතුන් භාරයේ තබා නොගන්නා බවත්, බැතිමතුන් විසින් පූජා වට්ටි සමග පූජා කරනු ලබන තුඩු පඩුරු වලට අමතරව පූජා කරනු ලබන සියළුම භාණ්ඩ අනිකුත් රත්‍රං භාණ්ඩ මාසික තේවාව භාර කපු මහතාට අයත් වන බවත්, මාසික තේවාව භාර කපු මහතුන් විසින් එම සම්ප්‍රධාය අනුව කටයුතු කරමින් සිටින බවත්, බැතිමතෙකු

කලාට පස්සේ නිලමේ තුමා මටත් කථා කරලා මොනවද වෙලා තියෙන්නේ කියලා ...

විසින් 2019.07.03 දින රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන ලද රත්‍රං තැටියක් දේවාල මාළිගාවේ නොමැති වී පිළිබදව මාධ්‍ය වල ප්‍රචාරය වූ පසුව දැනගත් බවත්, ජන මාධ්‍ය වලින් ප්‍රචාරය වූ රත්‍රං තැටිය 2019 වර්ෂයේ පෙරහැර මාසයේ දේවාලයට පූජා කිරීම පිළිබද මා කිසිවක් නොදන්නා බවත්, මාධ්‍ය වලින් ප්‍රචාරය වූ ආකාරයේ රත්‍රං තැටියක් දේවාල මාළිගාවේ තිබුණා ද කියා නොදන්නා බවත්, ප්‍රකාශ කර සිටී.

xv. <u>නිමලත් රත්නායක අනුර යන අයගේ ප්‍රකාශය</u>

වසර 35 ක පමණ කාලයක සිට රුහුණු මහා කතරගම දේවාලයේ කටයුතු කරන බවත්, 2014 වසරේ සිට කපුධුරන්ධර තනතුර දරන බවත්, කපු මහතුන් 15 දෙනෙක් රුහුණු මහා කතරගම දේවාලයේ සේවය කරන බවත්, ඉන් ඔහුත්, ප්‍රධාන කපු මහතාත්, සරත් සේපාල ටී රත්නායක, කරුණාරත්න ටී රත්නායක, ලාල් අරාපක්ෂ, ආනන්ද ටී රත්නායක, එම්.එම්. සමන් ප්‍රියන්ත, ටී.ආර්. සනත් ප්‍රේමකුමාර, ටී.ආර්. අනුර, ටී.ආර්. ලලිත් රත්නායක යන කපු මහතුන් මාසික තේවාව භාරව කටයුතු කරන බවත්, දියකපන කපුරාළ වශයෙන් උපුල් නිලන්ත සමරකෝන් කටයුතු කරන බවත්, තේවාව භාරව කටයුතු කරන කපු මහත්වරුන් හතර දෙනෙකුගේ පුතුන් හතර දෙනෙක් වන නිමලත් රත්නායක සිනෙත් පියුෂාන්, අරාපක්ෂ මුදියන්සේලාගේ ගයාන් චමිල බණ්ඩාර, සචිත් චානක නිමලත් රත්නායක සහ ටී.ආර්.දේවින්ද සම්පත් යන අයද කපු මහතුන් වශයෙන් ඔවුන්ගේ පියා මාසික තේවාව කරන කාලයේ දී සහයට කටයුතු කරන බවත්, ඔහු ඇතුළු කපු මහතුන් 14 දෙනාට සහ බස්නායක නිලමේ තුමාට පමනක් දේවාල මාළිගාවට ඇතුලු විය හැකි බවත්, බැතිමතුන් රුහුණු මහා කතරගම දේවාලයට පූජා වට්ටි සමග පඩුරු වශයෙන් මුදල් ද, රත්‍රං ඇතුලු භාණ්ඩ පූජා කරන බවත්, පූජා වට්ටි සමග පූජා කරන පඩුරු මුදල් අයත් වන්නේ මාසික තේවාව භාර කපු මහතා බවත්, කාර්‍යාලයේ රිසිට්පත් කඩා පූජා කරනු ලබන භාණ්ඩ හැර බැතිමතුන් දේවාලයට පූජා කරන රත්‍රං සහ භාණ්ඩද මාසික තේවාව භාර කපු මහතාට අයත් වෙන බවත්, එය රුහුණු මහා කතරගම දේවාලයේ පැවත එන සම්ප්‍රධාය බවත්, පූජා කරනු ලබන රත්‍රං පිළිම ඇතුලු දේව ආභරණ පමණක් දේවල මාළිගාවේ තැන්පත් කරනු ලබන බවත්, ඒ හැර අනිකුත් භාණ්ඩ මාසික තේවාව භාර කපු මහතාට සම්ප්‍රධානුකූලව අයිති වන බවත්, සම්ප්‍රධානුකූලව බැතිමතුන් පූජා කරන තුටු පඩුරු සහ රත්‍රං පිළිම හැර අනිකුත් රත්‍රං භාණ්ඩ ඇතුළු අනිකුත් භාණ්ඩ මාසික තේවාව භාර කපු මහතා අයත් වන අතර ඒවා එම කපු මහතුන් විසින් පරිහරණය කිරීම සිදු කරනු ලබන බවත්, බැතිමතෙකු විසින් 2019.07.03 දින රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන ලද රත්‍රං තැටියක් දේවාල මාළිගාවේ නොමැති වී පිළිබදව මාධ්‍ය වල ප්‍රචාරය වූ පසුව දැනගත් බවත්, ජන මාධ්‍ය වලින් ප්‍රචාරය වූ රත්‍රං තැටිය 2019 වර්ෂයේ පෙරහැර මාසයේ දේවාලයට පූජා කිරීම පිළිබද මා කිසිවක් නොදන්නා බවත් මාධ්‍ය වලින් ප්‍රචාරය වූ ආකාරයේ රත්‍රං තැටියක් දේවාල මාළිගාවේ තිබුණා ද කියා නොදන්නා බවත්, ප්‍රකාශ කර සිටී.

xvi. <u>නිමලත් රත්නායක කරුණාරත්න යන අයගේ ප්‍රකාශය</u>

වසර 40 ක පමණ කාලයක සිට රුහුණු මහා කතරගම දේවාලයේ කටයුතු කරන බවත්, 1982 වසරේ සිට කපුධුරන්ධර තනතුර දරන බවත්, කපු මහතුන් 15 දෙනෙක් රුහුණු මහා කතරගම දේවාලයේ සේවය කරන බවත්, ඉන් ඔහුත්, ප්‍රධාන කපු මහතාත්, සරත් සේපාල ටී රත්නායක, කරුණාරත්න ටී රත්නායක, ලාල් අරාපක්ෂ, ආනන්ද ටී රත්නායක, එම්.එම්. සමන් ප්‍රියන්ත, ටී.ආර්. සනත් ප්‍රේමකුමාර, ටී.ආර්. අනුර, ටී.ආර්. ලලිත් රත්නායක යන කපු මහතුන් මාසික තේවාව භාරව කටයුතු කරන බවත්, දියකපන කපුරාළ වශයෙන් උපුල් නිලන්ත සමරකෝන් කටයුතු කරන බවත්, තේවාව භාරව කටයුතු කරන කපු මහත්වරුන් හතර දෙනෙකුගේ පුතුන් හතර දෙනෙක් වන නිමලත් රත්නායක සිනෙත් පියුෂාන්, අරාපක්ෂ මුදියන්සේලාගේ ගයාන් චමිල බණ්ඩාර, සචිත් චානක නිමලත් රත්නායක සහ ටී.ආර්.දේවින්ද සම්පත් යන අයද කපු මහතුන් වශයෙන් ඔවුන්ගේ පියා මාසික තේවාව කරන කාලයේ දී සහයට කටයුතු කරන බවත්, ඔහු ඇතුළු කපු මහතුන් 14 දෙනාට සහ බස්නායක නිලමේ තුමාට පමනක් දේවාල මාළිගාවට ඇතුලු විය හැකි බවත්, බැතිමතුන් රුහුණු මහා කතරගම දේවාලයට පූජා වට්ටි සමග පඩුරු වශයෙන් මුදල් ද, රත්‍රං ඇතුලු භාණ්ඩ පූජා කරන බවත්, ඒවා වන්නේ මාසික තේවාව භාර කපු මහතාට අයිති වන බවත්,කාර්‍යාලයේ රිසිට්පත් කඩා බැතිමතුන් පූජා කරනු ලබන භාණ්ඩ සහ දේවාලයේ පඩුරු පෙට්ටි වලට පූජා කරනු ලබන මුදල් පුද පඩුරු ලෙස සලකනු ලබන අතර ඒවා බෞද්ධ කටයුතු කොමසාරිස් යටතේ ක්‍රියාත්මක වන බස්නායක නිලමේ තුමාට අයති වන බවත්, බැතිමතුන් විසින් පූජා වට්ටි සමග පූජා කරනු ලබන තුටු පඩුරු වලට අමතරව පූජා කරනු ලබන රත්‍රං පිළිම සමග අනිකුත් රත්‍රං භාණ්ඩ මාසික තේවාව භාර කපු මහතාට අයත් වන බවත්, නමුත් බැතිමතුන් දේවාභරණ වශයෙන් පූජා කරනු ලබන රත්‍රං භාණ්ඩ තිබෙනම් යුතුකමක් වශයෙන් තේවාව භාර කපු මහතා ඒවා දේවාල මාළිගාවේ තැන්පත් කල යුතු බවත්.. ඒක අවුරුදු පන්දාහක විතර ඉදලා පැවතගෙන ආ සම්ප්‍රදායක් බවත්. දේවාභාරණයක් කියලා තිරණය වෙන්නේ දේව පිළිම, දේව රූප කොටා ඇති භාණ්ඩ පමණක් වන බවත්, බැතිමතෙකු විසින් 2019.07.03 දින රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන ලද රත්‍රං තැටියක් දේවාල මාළිගාවේ නොමැති වී පිළිබදව මාධ්‍ය වල ප්‍රචාරය වූ පසුව දැනගත් බවත්, ජන මාධ්‍ය වලින් ප්‍රචාරය වූ රත්‍රං තැටිය 2019 වර්ෂයේ පෙරහැර මාසයේ දේවාලයට පූජා කිරීම පිළිබද මා කිසිවක් නොදන්නා බවත් මාධ්‍ය වලින් ප්‍රචාරය වූ ආකාරයේ රත්‍රං තැටියක් දේවාල මාළිගාවේ තිබුණා ද කියා නොදන්නා බවත්, ප්‍රකාශ කර සිටී.

xvii. <u>සචිත් චානක නිමලත් රත්නායක යන අයගේ ප්‍රකාශය</u>

වසර 04 ක පමණ කාලයක සිට රුහුණු මහා කතරගම දේවාලයේ කටයුතු කරන බවත්, 2017 වසරේ සිට ඝංය කපුධුරන්ධර තනතුර දරන බවත්, කපු මහතුන් 15 දෙනෙක් රුහුණු මහා කතරගම දේවාලයේ සේවය කරනවා. ඉන් මගේ පියා වන තිබිලන් රත්නායක කරුණාරත්නත් , ප්‍රධාන කපු මහතාත්, සරත් සේපාල වී රත්නායක, අනුර වී රත්නායක, ලාල් අරාපක්ෂ, ආනන්ද වී රත්නායක, එම්.එම්. සමන් ප්‍රියන්ත, ලලිත් මුණසිංහ, සනත් ප්‍රේමකුමාර, ටී.ආර්. ලලිත් රත්නායක යන කපු මහතුන් මාසික තේවාව භාරව කටයුතු කරන බවත්, මම සහ තවත් කපු මහත්වරුන් තුන් දෙනෙකුගේ පුතුන් තුන් දෙනෙක් වන තිබිලන් රත්නායක සිනෙත් පියුෂාන්, අරාපක්ෂ මුදියන්සේලාගේ ගයාන් චමිල බණ්ඩාර, සහ ටී.ආර්.දේවින්ද සම්පත් යන අයද කපු මහතුන් වශයෙන් ඔවුන්ගේ පියා මාසික තේවාව කරන කාලයේ දී සහයට කටයුතු කරන බවත්, නමුත් අපි 04 දෙනාට සහ දිය කපන කපුරාළ වශයෙන් කටයුතු කරන උපුල් කපු මහතා මාසික තේවාව භාරව කටයුතු නොකරන බවත්, ඔහු ඇතුළු කපු මහතුන් 15 දෙනාට සහ බස්නායක නිළමේ තුමාට පමනක් දේවාල මාලිගාවට ඇතුළු විය හැකි බවත්, බැතිමතුන් රුහුණු මහා කතරගම දේවාලයට පූජා වට්ටි සමග පඩුරු වශයෙන් මුදල් ද, රත්‍රං ඇතුළු භාණ්ඩ පූජා කරන බවත් බැතිමතුන් පූජා වට්ටි සමග පූජා කරන පඩුරු මුදල් අයත් වන්නේ මාසික තේවාව භාර කපු මහතාට බවත්, කාර්‍යාලයේ රිසිට්පත් කඩා බැතිමතුන් පූජා කරනු ලබන භාණ්ඩ සහ දේවාලයේ පඩුරු පෙට්ටි වලට පූජා කරනු ලබන මුදල් අයත් වන්නේ බෞද්ධ කටයුතු කොමසාරිස් යටතේ ක්‍රියාත්මක වන බස්නායක නිලමේ තුමාට බවත්, බැතිමතුන් විසින් පූජා වට්ටි සමග පූජා කරනු ලබන තුටු පඩුරු වලට අමතරව පූජා කරනු ලබන රත්‍රං පිළිම සමග අනිකුත් රත්‍රං භාණ්ඩ මාසික තේවාව භාර කපු මහතාට අයත් වන බවත්, නමුත් බැතිමතුන් දේවාභරණ වශයෙන් පූජා කරනු ලබන රත්‍රං භාණ්ඩ තිබෙනම් යුතුකමක් වශයෙන් තේවාව භාර කපු මහතා ඒවා දේවාල මාලිගාවේ තැන්පත් කල යුතු බවත්, ඒක අවුරුදු පන්දාහක විතර ඉදලා පැවතගෙන ආ සම්ප්‍රදායක් බවත්, දේවාභාරණයක් කියලා තිරණය වෙන්නේ දේව පිළිම, දේව රූප කොටා ඇති භාණ්ඩ පමණක් වන බවත්, සම්ප්‍රධානුකූලව බැතිමතුන් පූජා කරන තුටු පඩුරු සහ රත්‍රං පිළිම හැර අනිකුත් රත්‍රං භාණ්ඩ ඇතුළු අනිකුත් භාණ්ඩ මාසික තේවාව භාර කපු මහතාට අයත් වන බවත්, බැතිමතෙකු විසින් 2019.07.03 දින රුහුණු මහා කතරගම දේවාලයට පූජා කරන ලද රත්‍රං තැටියක් දේවාල මාලිගාවේ නොමැති වී පිළිබදව මාධ්‍ය වල ප්‍රචාරය වු පසුව දැනගත් බවත්, ජන මාධ්‍ය වලින් ප්‍රචාරය වු රත්‍රං තැටිය 2019 වර්ෂයේ පෙරහැර මාසයේ දේවාලයට පූජා කිරීම පිළිබද මා කිසිවක් නොදන්නා බවත් මාධ්‍ය වලින් ප්‍රචාරය වු ආකාරයේ රත්‍රං තැටියක් දේවාල මාලිගාවේ තිබුණා ද කියා නොදන්නා බවත්, ප්‍රකාශ කර සිටී.

05. මේ දක්වා සිදු කල විමර්ශණයේදි පහත කරුනු අණාවරණය වී ඇත.

i. දිසානායක මොහොට්ටිලාගේ සුජිත් ප්‍රසන්න, අමිල නුවන් මුණසිංහ, මුණසිංහ මාන්නප්පෙරුමගේ ජනක පුෂ්පකුමාර, මුණසිංහ මාන්නප්පෙරුමගේ සමන් ප්‍රියන්ත නොහොත් චූටි කපු මහතා යන අයවළුන්ගේ ප්‍රකාශයන් අනුව 2019.07.03 දින රුහුණු මහා කතරගම දේවාලයට රත්‍රං තැටිය පූජා කරන ලද බව ,

ii. එසේම මොහොට්ටිලාගේ සුජිත් ප්‍රසන්න, අමිල නුවන් මුණසිංහ, මුණසිංහ මාන්නප්පෙරුමගේ සමන් ප්‍රියන්ත නොහොත් චූටි කපු මහතා යන අයවළුන්ගේ ප්‍රකාශයන් අනුව 2019.07.03 දින රත්‍රං තැටිය පූජා කරන අවස්ථාවේ ප්‍රධාන කපු මහතා වන සොමිපාල ටී රත්නායක මහතා සිටි බවත් එම දිනය ඔහුගේ මාසයට අදාළ දිනයක් බවත් එදින පූජා කිරීමෙන් පසු රත්‍රං තැටිය දියකපන කපු මහතා වන කෝනාර මුදියංසේලාගේ උපුල් නිලන්ත සමරකෝන් විසින් දේවාල මාලිගාවේ තැබූ බව,

iii. කෝනාර මුදියංසේලාගේ උපුල් නිලන්ත සමරකෝන්ගේ ප්‍රකාශ අනුව 2019.07.03 දින රත්‍රං තැටිය පූජා කිරීම පිලිබදව කරුනු නොදන්නා බව සහ ඔහු විසින් එවැනි රත්‍රං තැටියක් දේවාල මාලිගාවේ තැන්පත් නොකල බව.

iv. මුණසිංහ මාන්නප්පෙරුමගේ සමන් ප්‍රියන්ත නොහොත් චූටි කපු මහතාගේ ප්‍රකාශය අනුව 2019.07.03 දින පූජාකල රත්‍රං තැටිය ඊට සතියකට පමණ පසු ප්‍රධාන කපු මහතා වන සොමිපාල ටී රත්නායක විසින් කරන ලද දැනුම් දිම මත දේවාළ මාලිගාවේ සිට රතුපාට රෙදි කැබැල්ලක ඔතාගෙන විත් මාසය භාර කපු මහතුන් සිටින කාමරයේදි සොමිපාල ටී රත්නායක මහතා වෙත මෙසය මත තබා භාර දුන් බවත්, ඒ අවස්ථාවේ සොමිපාල ටී රත්නායකගේ කකුල් මිරිකමින් මුත්තුසාමි කන්දසාමි නොහොත් කන්දා යන අය සිටි බව,

v. මුත්තුසාමි කන්දසාමි නොහොත් කන්දා යන අයගේ ප්‍රකාශය අනුව 2019 ජුලි මාසයේ දවසක තේවාව භාර කපු මහතුන් සිටින නිළ කාමරයේ සවස පූජාවෙන් පස්සේ ප්‍රධාන කපු මහත්තයා නිළ කාමරයේ ඉස්සරහා පුටුවේ වාඩි වෙලා ප්‍රධාන කපු මහත්තයාගේ කකුල් මිරික මිරික සිටි අවස්ථාවේ මුණසිංහ මාන්නප්පෙරුමගේ සමන් ප්‍රියන්ත නොහොත් චූටි කපු මහත්තයා රතුපාට රෙදි කැල්ලකින් ඔතපු තැටියක් අරගෙන පැමිණි බවත්, එය ප්‍රධාන කපු මහත්තයාගේ දැනුම් දීම අනුව චූටි කපු මහතා විසින් එය ඇතුලේ මේසේ උඩින් තබා ප්‍රධාන කපු මහත්තයාගේ කකුල් දෙක අල්ලලා වැදලා දේවාලයට ගිය බව.

vi. රත්‍රං තැටිය පූජා කල බවට අණාවරනය වී ඇති 2019.07.03 දින මාසය භාර කපු මහතා වශයෙන් සේවය කර ඇත්තේ ප්‍රධාන කපු මහතා වන සොමිපාල ටී රත්නායක වන බව.

vii. මෙම සිද්ධිය සම්බන්ධව පැමිණිළි කර විමර්ශණ ආරම්භ කිරීමෙන් පසු 2019.07.03 දින දේවාලයට පූජාකල බවට වූ රත්‍රං තැටිය ලෙස රත්‍රන් තැටියක් නැවත දේවාලයේ පරිපාලන ලේකම් වෙත 2021.10.26 දින මුණසිංහ මාන්නප්පෙරුමගේ අජිත් පුෂ්පකුමාර විසින් භාර දී ඇති බව.